සවිස්තර වර්ණනා සහිත

# පටිච්ච සමුප්පාදය



සිතියම් සහිතයි

පානදුරේ වලපොල ශ්‍රී සද්ධමොදය පිරිවෙන්හි වැසි

දම්පැල්ලේ ගුණසිරි සවාමීන් වහන්සේ

විසින් සංශොධිතයි.

පී. ජේ. කරුණාධාර විසින්

මරදානේ කරුණාධාර මුද්‍රණාලයෙහි මුද්‍රිතයි.

මිල රු 1-50 යි.

සිතියම් හා සවිස්තර වර්ණනා සහිත

# පටිච්ච සමුප්පාදය

පාණදුරේ වල්පොල ශ්‍රී සද්ධර්මෝදය පිරිවෙන් වැසි

දම්පැල්ලේ ගුණසිරි ස්වාමින් වහන්සේ

විසින් සංශෝධිතයි.

---

පී. ජේ. කරුණාධාර විසින්

මරදානේ කරුණාධාර මුද්‍රණාලයෙහි මුද්‍රිතයි.

---

2500

1956

# සංඥාපනය.

ප්‍රතීත්‍ය සමුත්පාදය වූකලී බුද්ධාගමයෙහි සඳහන් හේතු ඵල ධර්මයකි. මෙහි දැක්වෙනුයේ සත්ත්වයා අනමතග්‍ර සංසාරයෙහි සැරිසරණ-ගමන් කරන පිළිවෙළයි.

චතුරසංඛ්‍යෙය කල්ප ලක්ෂයක් පිරූ පැරුම් ඇති අප මහ බෝසතාණන් වහන්සේ යම් වෛශාඛ පෞර්ණමී දිනයක රෑ තුන්යම්හි පිළිවෙළින් යම් ත්‍රිවිද්‍යා ඥානයන් පිළි ලැබ බුද්ධරාජන් වූසේක්ද, උන්වහන්සේ විසින් පළමුකොට ම හේතු ඵල ධර්ම දෙළොසකින් හෙබියාවූ මේ ප්‍රතීත්‍ය සමුත්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සම්මර්ශනය කළසේක. තදනන්තරව "අනෙක ජාති සංසාරං" යනාදි ප්‍රීති වාක්‍යය පහළ කළසේක.

චතුරාර්යසත්‍යය, සර්වඥතාඥානය, ප්‍රතිසන්ධිය, ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ප්‍රත්‍යයාකාරය යන මේ කරුණු සතර බුද්ධාගමයෙහි ඇතුළත් අතිශය ගැඹුරු ධර්මයන් බැව් "බුද්ධඝොෂාදී" අර්ථකථාචාර්යවරයන් විසින් දක්වනලදී. එහෙයින් මේ ධර්මයන්ගේ යථා ස්වභාවය දැන ඉගෙනගැනීම කථාන්තරයන්හි තේරුම් දැන ඉගෙනීම මෙන් එතරම් ලෙහෙසි පහසු නොවන්නේමය. කෙතරම් ගැඹුරු ධර්මයක් වුවද නැවත නැවත පරිශීලනය කිරීමෙන් හා ගුරූපදෙශාශ්‍රයෙන්ද උත්සාහවත් නැණවතුන්ට දැන ඉගෙන ගත හැකිවේ.

මේ විශිෂ්ට ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය අද වියතුන්ගේ ගෞරව සම්මානයට කෙතරම් දුරට පාත්‍රව ඇත්ද යන්න මෙයට පෙර අවර දෙදිග කීර්තිමත් විශාරදයන් විසින් ඒ ඒ භාෂාවන්ගෙන් ලියා ප්‍රසිද්ධකරන ලද අනේක ව්‍යාඛ්‍යා සංග්‍රහයෙන්ම අපට අවබොධ කරගත හැකිය.

අප ලාංකික සාමාන්‍ය බෞද්ධ ජනතාවගේ විශෙෂ ප්‍රයෝජනය සලකාගෙන අප විසින්ද මේ සවිස්තර වර්ණනා සහිත ප්‍රතීත්‍ය සමුත්පාදය උගත් ඇම්. ආරියරතන තිස්ස ස්වාමීන් වහන්සේ ලවා සම්පාදනය කරවාගෙන සුදුසු තන්හි අර්ථාවබෝධයට පහසු වන අයුරු මේ ප්‍රතිරූපවලින්ද සරසා මෙයට ප්‍රථමයෙන්ද දෙවරක් මුද්‍රණාධාරයෙන් ප්‍රසිද්ධ කරණ ලදී.

මෙවර මෙහි සංශෝධන පූර්වක ශොධ්‍යපත්‍ර පාණදුරේ වලපොල; ශ්‍රී සද්ධර්මෝදය පිරිවෙන්හි දම්පැල්ලේ ගුණසිරි ස්වාමීන් වහන්සේ ලවා කරවා ගන්නට ලැබුන බැව් ගෞරවයෙන් සඳහන් කරමිහ.

මේ වර මුද්‍රණයද යුහුසුලුව කරන්නට යෙදුනු නිසා මෙහි යම් යම් ප්‍රමාද දෝෂස්ථාන ඇතිවිය හැකි හෙයින් එහිලා ධර්මධරයන්ගේ උපෙක්ෂාවම අපෙක්ෂා කරමිහ.

"කරුණාධාරමුද්‍රණාලය" ජී. ජේ. කරුණාධර

නො: 97, මාලිගාකන්ද පාර,

මරදාන.

15-6-56

# පටිච්ච සමුප්පාදය

නමොතසස භගවතො අරහතො
සමමා සම්බුඩසස

1 තෙන සමයෙන බුඬො භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤජරාය තීරෙ බොධි රුකඛමූලෙ පඨමාභිසම්බුඬො.

2 අථ ඛො භගවා බොධි රුකඛ මූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්ති සුඛපටිසංවෙදී.

2 අථ ඛො භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි.

4 අවිජජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාමරූප පච්ච යා සළායතනං සළායතන, පච්චයා

ඵස්සො, ඵස්සපච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භවපච්චයා ජාති ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දෙමනස්සු'පායාසා සම්භවන්ති.

එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

5 අවිජ්ජායත්වෙ'ව අසෙස විරාග නිරොධා සංඛාරනිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො සළායතන නිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වේදනා නිරොධො. වේදනා නිරොධා තණ්හා නිරොධො. තණ්හා නිරොධා උපාධාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරො

ධා ජාති නිරොධා, ජාති නිරොධා
ජරා මරණං සොක පරිදෙව දුක්ඛ
දොමනස්සු'පායාසා නිරුජ්ඣන්ති.

එවමෙත'ස්ස කෙවලස්ස දුක්ඛක්ඛ
න්ධස්ස නිරොධො හොතීති.

6 අථ ඛො භගවා එතම'ත්ථං විදි
ත්වා තායං වෙලායං ඉමං උදානං
උදානෙසි.

7 යදා හවෙ පාතු භවන්ති ධම්මා,
ආතාපිනො ඣායතො
බ්‍රාහ්මණස්ස
අථ'ස්ස කංඛා වපයන්ති සබ්බා,
යතො පජානාති සහෙතු
ධම්මන්ති.

8 අථ ඛො භගවා රත්තියා මජ්ඣි
මං යාමං පටිච්චසමුප්පාදං අනුලො
ම පටිලොමං මනසා'කාසි.

9 අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර
පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්ච
යා නාම රූපං, නාම රූප පච්චයා

සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං. උපාදාන පච්චයා භවො. භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සොකපරිදෙව දුක්ඛ දොමනස්සු'පායාසා සම්භවන්ති.

එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

10 අවිජ්ජායත්වෙ'ව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාම රූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපා

දාන නිරෝධා භව නිරෝධො, භව නිරෝධා ජාති නිරෝධො, ජාති නිරෝධා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සු'පායාසා නිරුජ්ඣන්ති.

එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධො හොතීති.

11 අථ ඛො භගවා එතම'ත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

12 යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො
බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා,
යතො ඛයං පච්චයානං
අවෙදීති,

13 අථ ඛො භගවා රත්තියා පච්ඡිමං යාමං පටිච්චසමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි.

14 අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සොකපරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති.

එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

15 අවිජ්ජායත්වෙ'ව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා

වේදනා නිරෝධෝ, වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ, තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ, උපාදාන නිරෝධා, භවනිරෝධෝ භව නිරෝධා ජාති නිරෝධෝ, ජාති නිරෝධා ජරාමරණං සෝක පරිදේව දුක්ඛ දෝමනස්සු'පායාසා නිරුජ්ඣන්ති.

එවමෙ'තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝතීති.

16 අථ ඛෝ භගවා එතම'ත්ථං විදිත්වා තායං වේලායං ඉමං උදානං උදානේසි.

17 යදා හවේ පාතුභවන්ති ධම්මා,
ආතාපිනෝ ඣායතෝ
බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසේනං
සූරියෝ'ව ඕභාසය ම'න්ත
ලික්ඛන්ති

18 අනෙකජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො
දුක්ඛා ජාති පුනප්පුනං

19 ගහකාරක දිට්ඨොසි
පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා
ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාරගතං චිත්තං
තණ්හානං ඛයමජ්ඣගා

පටිච්චසමුප්පාද පාළි
නිට්ඨිතං

# පටිච්ච සමුප්පාද සන්නය.

## නමො බුද්ධාය.

**1. තෙන සමයෙන බුද්ධො භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො.**

1. තෙන සමයෙන, (ඒ සමයෙක්හි බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කොට සර්වඥ සම්බොධියට පැමිණිසේක්ද) එසමයෙහි හෙවත් එකල්හි; භගවා, භාග්‍යවත්වූ; බුද්ධො, සර්වඥ රාජොත්තමයන් වහන්සේ; උරුවෙලායං, උරුවෙල් දනව්වෙහි; නෙරඤ්ජරාය නජ්ජා තීරෙ, නෙරංජා නම් වූ නදීහුගේ ඉවුර සමීපයෙහි වූ බොධි රුක්ඛ මූලෙ, ශ්‍රී මහාබොධිරාජයාගේ මූලයෙහිවූ;(වජ්‍රාසන මස්තකයෙහි) පඨමාභිසම්බුද්ධො, අභිසම්බොධියට (සර්වඥතාඥානයට) පැමිණි පළමුවන කල් ඇත්තේ; විහරති, වාසය කර වදාරණසේක.

**2. අථ ඛො භගවා බොධිරුක්ඛමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛපටිසංවෙදී.**

2. අථ ඛො, ඉක්බිතිව වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; බොධි රුක්ඛමූලෙ, ශ්‍රී මහා බොධිරාජයාගේ මූලයෙහි; (වජ්‍රාසන මස්තකයෙහි; සත්තාහං, සත් දවසක් මුළුල්ලෙහි; එකපල්ලඞ්කෙන, එකම පර්‍ය්‍යඞ්කයෙන් උපලක්ෂිතව; විමුත්තිසුඛපටිසංවෙදී, විමුක්ති සැප විඳිනසේක් (අර්හත් ඵල සමාපත්ති සුව විඳිමින්); නිසීදි, වැඩහුන්සේක.

**3. අථ ඛො භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි.**

3. අථ ඛො, ඉක්බිතිව වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රත්තියා, රාත්‍රියගේ; පඨමං යාමං, ප්‍රථම යාමය මුළුල්ලෙහි; පටිච්ච සමුප්පාදං, (ද්වාදශාඞ්ගයකින් සමුපලක්ෂිතවූ) ප්‍රතීත්‍යසමුත්පාදය; අනුලොම පටිලොමං, අනුලොමක ප්‍රතිලොම වශයෙන්; මනසාකාසි, (මේ මතු ප්‍රකාශ වන පරිද්දෙන) මෙනෙහි කළසේක. ඒ කෙසේද යත්:-

4. අවිජ්ජා පච්චයා සංඛාර, සංඛාරා පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාම රූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සු'පායාසා සම්භවන්ති.

එවමෙ'තස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

4. අවිජ්ජා පච්චයා, අවිද්‍යා ප්‍රත්‍යයෙන්; (අනුවණකම හෙතු කොට ගෙන) සංඛාරා, සංස්කාරයෝ; (ලෞකික කුශලා කුශල චෙතනාවෝ) සම්භවන්ති, පහළවෙත්; සංඛාරපච්චයා, සංස්කාර යන්ගේ හේතුවෙන්; විඤ්ඤාණං, ප්‍රතිසන්ධි විඥානය වේ. විඤ්ඤාණ පච්චයා (ප්‍රතිසන්ධි චිත්ත සංඛ්‍යාත) විඥානයාගේ හේතුවෙන්; නාම රූපං, නාමය හා රූපය වේ. නාම රූප පච්චයා, නාම රූප යන්ගේ හේතුවෙන්; සළායතනං, ෂඩ්විධ ආයතනය වේ. සළා-යතන පච්චයා, ෂඩායතනයන්ගේ හේතුවෙන්; ඵස්සො, ස්පර්ශයවේ ඵස්ස පච්චයා, ස්පර්ශයාගේ හේතුවෙන්; වෙදනා, වෙදනාව වේ. වෙදනා පච්චයා, වේදනාවගේ හේතුවෙන්; තණ්හා, තෘෂ්ණාව වේ තණ්හා පච්චයා, තෘෂ්ණාවගේ හේතුවෙන්; උපාදානං, (අරමුණු දැඩි සේ ගැණීම් ලක්ෂණ කොට ඇති) උපාදානය වේ. උපාදාන පච්චයා, උපාදානයාගේ හේතුවෙන්; භවො, (කර්ම) භවය වේ. භව පච්චයා, කර්ම භවයාගේ හේතුවෙන් (ස්කන්ධයන්ගේ පහළවීම යයි කියන ලද); ජාති, ජාතිය (උත්පත්තිය) වේ. ජාති පච්චයා, ජාතිහුගේ හේතුවෙන්; ජරා මරණං, ජරාව හා මරණයද; සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා, ශොකය හැඬීමය කායික දුඃඛය මානසික දුඃඛය දැඩිවූ චිත්තයාගේ ආයාසය යන මොව්හු; සම්භවන්ති, පහළ වෙත්.

එවං, යම්සේ; එතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ සියලු දුක් රාශියගේ; සමුදයො හොති, පහළ වීම වේ.

5. අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාම රූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සු'පායාසා නිරුජ්ඣන්ති.

**එවමෙ'තස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති**

5. අවිජ්ජා ත්වෙව තු, අවිද්‍යාවගේම වනාහී; අසෙස විරාග නිරොධා, (මාර්ගඥානය කරණකොට ගෙන) නිරවශෙෂ නිරොධ හෙතුවෙන්; සඞ්ඛාර නිරොධො, සංස්කාරයන්ගෙන් අනුත්පාද නිරොධය වේ; සඞ්ඛාර නිරොධා, සංස්කාරයන්ගේ නිරොධ හෙතුවෙන්; විඤ්ඤාණ නිරොධො, (ප්‍රතිසන්ධි) විඥානයාගේ නිරොධය වේ; විඤ්ඤාණ නිරොධා, විඥානයාගේ නිරොධ හේතුවෙන්; නාම රූප නිරොධො, නාම රූපයන්ගේ නිරොධය වේ. නාම රූප නිරොධා, නාම රූපයන්ගේ නිරොධ හේතුවෙන්; සළායතන නිරොධො'ෂට් විධ ආයතනයන්ගේ නිරොධය වේ; සළායතන නිරොධො, ෂඩායතනයන්ගේ නිරොධ හේතුවෙන්; ඵස්ස නිරොධා, ස්පර්ශයාගේ නිරොධය වේ. ඵස්ස නිරොධා, ස්පර්ශයාගේ නිරොධ හේතුවෙන්; වෙදනා නිරොධො, වේදනාවගේ නිරොධය වේ. වෙදනා නිරොධා, වේදනාවගේ නිරොධ හේතුවෙන්; තණ්හා නිරොධො, තෘෂ්ණාවගේ නිරොධය වේ. තණ්හා නිරොධා, තෘෂ්ණාවගේ නිරොධ හේතුවෙන්; උපාදාන නිරොධො, උපාදානයාගේ නිරොධය වේ. උපාදාන නිරොධා, උපාදානයාගේ නිරොධ හේතුවෙන්; භව නිරොධො, (කර්ම) භවයාගේ නිරොධය වේ. භව නිරොධා, (කර්ම) භවයාගේ නිරොධ හේතුවෙන්; ජාති නිරොධො, ජාතිහුගේ නිරොධ හේතුවෙන්; ජරා මරණං, ජරාව හා මරණයද; සොක පරිදෙව දුක්ඛ දොමනස්සු'පායාසා, ශොකය හැඬීමය කායික දුඃඛය මානසික දුඃඛය සිතෙහි දැඩි ආයාසය යන මොහු; නිරුජ්ඣන්ති, නිරුද්ධ වෙත්.

එවං, මෙසේ; එතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ සියළු දුක් රාශියගේ; නිරොධො හොතීති, නිරොධය වේ, හෙවත් නැවත නූපදනා පරිද්දෙන් නැසීම වන්නේය.

මෙසේ අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කොට වදාළ සේක.

6 අථ ඛො භගවා එතම'ත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

6. අථ ඛො, ඉක්බිතිවැ වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ, එතං අත්ථං, අවිද්‍යාදීන් විද්‍යමාන කල්හි සංස්කාරාදි දුක් සමූහයාගේ පහළවීම ද වෙයි යන මේ කාරණය; විදිත්වා (සියලු) ආකාරයෙන්) දැන වදාරා; තායං වෙලායං, ඒ වේලෙහි; ඉමං උදානං, මේ ප්‍රීති වාක්‍යය; උදානෙසි, පවත්වා වදාළ සේක.

7. යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො පජානාති සහෙතු ධම්මං.

7. හවෙ, ඒකාන්තයෙන්; යදා, යම් කලෙක්හි; ආතාපිනො, (කෙලෙස් තවන සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය ඇත්තාවූ), ඣායතො, (ආරම්මණූපනිධ්‍යාන-ලක්ඛණූපනිධ්‍යානයන් ලක්ෂණකොට ඇත්තාවූ ධ්‍යානයෙන්) ධ්‍යානවඩන්නාවූ; බ්‍රාහ්මණස්ස, (දුරුකරණලද පව් ඇති හෙයින්) බ්‍රාහ්මණ නම්වූ ක්ෂීණාශ්‍රවයානට; ධම්මා; (අනුලොම ප්‍රතිලොම ප්‍රත්‍යයාකාර ප්‍රතිවෙධ සාධක) සත්තිස් බොධිපාක්ෂික ඥාන ධර්ම විශෙෂයෝ; පාතු භවන්ති, පහළ වෙත් ද; අථ, එකල්හි; අස්ස, ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ; සබ්බා කඞ්ඛා, සියලු සැකයෝ; වපයන්ති, පහවෙත්; (කුමක් හෙයින් ද යත්) යතො, යම් හෙයකින්; සහෙතු ධම්මං පජානාති. අවිද්‍යාදිවූ හේතු වෙන් සහේතුකවූ සංස්කාරාදී සියලු ධර්මයන් අවබෝධ කෙළේද එහෙයිනි.

මෙසේ ප්‍රථම යාමයෙහි ප්‍රත්‍යයාකාරය ප්‍රතිවෙක්ෂා කිරීම් වශයෙන් උදන් අනා වදාළ සේක.

8. අථ ඛො භගවා රත්තියං මජ්ඣිමං යාමං පටිච්ච සමුප්පාදං අනුලොම පටිලොම මනසාකාසි.

8. අථ ඛො, ඉක්බිතිවූ වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රත්තියා, රාත්‍රියගේ; මජ්ඣිමං යාමං, මධ්‍යම යාමය මුළුල්ලෙහි; පටිච්ච සමුප්පාදං, (ද්වාදශාඞ්ග) ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය; අනුලොම පටිලොමං, අනුලොම ප්‍රතිලොම වශයෙන්; මනසි අකාසි, මෙනෙහි කළ සේක.

9. අවිජ්ජා පච්චයා සංඛාරා – පෙ – සමුදයො හොති

10. අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා – පෙ – නිරොධො හොතීති.

11. අථ ඛො භගවා – පෙ ඉමං උදානං උදානෙසි.

මෙහි සම්පූර්ණ පෙළ හා සන්නය 4, 5, 6 වෙනි අංක වලින් දැක්වූ ක්‍රමයෙන් දතයුතු.

12. යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො ඛයං පච්චයානං අවෙදීති.

12. භවෙ, ඒකාන්තයෙන්; යදා, යම් කලෙක්හි; ආතාපිනො (කෙලෙස් තවන) වීර්‍ය්‍ය ඇත්තාවූ; ඣායතො, හෙතුඵල උපනිධ්‍යාන කරන්නාවූ; බ්‍රාහ්මණස්ස, පවු දුරුකළාවූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට; ධම්මා, (අනුලොම ප්‍රත්‍යයාකාරාවබොධක) බොධිපාක්ෂික ඥාන විශෙෂයො; පාතු භවන්ති, පහළ වෙත්ද; අථ, එකල්හි; අස්ස, ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ; සබ්බා කංඛා, සියළු සැකයෝ; වපයන්ති, පහවෙත්; (කුමක් හෙයින් ද යත්) යතො; යම් හෙයකින්, පච්චයානං, අවිද්‍යාදි ප්‍රත්‍යයන්ගේ, ඛයං, ක්ෂය සංඛ්‍යාත නිර්වාණය; අවෙදි, අවබොධ කළ සේක්ද; එහෙයි නැයි වදාළ සේක.

13. අථ ඛො භගවා රත්තියා පච්ඡිමං යාමං පටිච්ච සමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි.

13. අථ ඛො, ඉක්බිති වැ වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රත්තියා, රාත්‍රියගේ; පච්ඡිමං යාමං, පශ්චිම යාමයෙහි පටිච්චසමුප්පාදං, (ද්වාදශාඞ්ග) ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය; අනුලොම පටිලොමං, අනුලොම ප්‍රතිලොම වශයෙන්; මනසි අකාසි' මෙනෙහි කළ සේක.

14. අවිජ්ජා පච්චයා සංඛාරා – පෙ – සමුදයො හොති.

15. අවිජ්ජායත්වෙව අසෙසවිරාග නිරොධා–පෙ–නිරොධො හොතීති.

16. අථ ඛො භගවා – පෙ – ඉමං උදානං උදානෙසි.

මෙහි සම්පූර්ණ පෙළ හා සන්නය 4, 5, 6 වෙනි අංක වලින් දැක්වූ ක්‍රමයෙන් දතයුතු.

17. යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං
සූරියොව ඔභාසය'මන්තලික්ඛන්ති,

17. හවෙ, ඒකාන්තයෙන්; යදා, යම් කලෙක්හි; ආතාපිනො (කෙලෙස් තවන) වීර්‍ය්‍ය ඇත්තාවූ; ඣායතො, ධ්‍යාන කරන්නාවූ; බ්‍රාහ්මණස්ස,(පවු දුරුකළාවූ) ක්ෂීණාශ්‍රවයන් වහන්සේට; ධම්මා, (අනුලොම ප්‍රත්‍යයාකාර ප්‍රතිවෙධසාධක බොධිපාක්ෂික) ඥාන විශෙෂයෝ; පාතු භවන්ති, පහළ වෙත්ද; (එකල්හි ඒ ක්ෂීණාශ්‍රව තෙම) මාරසෙනං, (කෙලෙස් නමැති) මාරසෙනාව; (කෙලෙස් සමූහයා) විධූපයං, විධ්වංසනය කෙරෙමින්; (පහකරමින්) තිට්ඨති,

සිරි; (කෙසේද යත්) අන්තලික්ඛං, අහස; ඔභාසං, බබුලුවන්නාවූ සූරියො ඉව, සූර්‍ය්‍ය දිව්‍යරාජයා මෙනි.

18. අනෙක ජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො
දුක්ඛා ජාති පුනප්පුනං

18. පුනප්පුනං, නැවත නැවත; ජාති, උත්පත්තිය; දුක්ඛා, (යම් හෙයකින්) දුක් වන්නීද; (එහෙයින්) ගහකාරක, (ආත්ම නමැති) ගෙය සාදන වඩුවා; ගවෙසන්තො, සොයන්නාවූ; (මම) අනේකජාතිසංසාරං, නොයෙක් ජාතියයි කියනලද මේ සසරෙහි; අනිබ්බිසං, (ගෘහකාරකයා දක්නා සම්‍යක් සම්බොධි ඥානය) නොලබන්නෙම්; සන්ධාවිස්සං, සැරිසරා ඇවිද්දෙමි.

19. ගහකාරක දිට්ඨොසි
පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා
ගහකූටං විසංඛිතං
විසංඛාරගතං චිත්තං
තණ්හානං ඛය මජ්ඣගා.

19. ගහකාරක, (ආත්ම නමැති මේ) ගෙය සාදන වඩුවා; දිට්ඨො අසි, (මා විසින් දුන් තෝ) දක්නා ලද්දෙහිය; (මම) පුන, නැවත; ගෙහං, (ආත්මය නමැති) ගෙයක්; න කාහසි, නොකරන්නෙහිය; (ඒ කුමක් හෙයින් ද යත්) තෙ, තාගේ; සබ්බා, සියලු; ඵාසුකා, (කෙලෙස් නමැති) පරාළයෝ; (ගෘහොපකරණ) භග්ගා; (අනිත් මාර්ග ඥාන නමැති පොරොවෙන්) බිඳ පියන ලද්දාහුය; ගහකූටං, ගෘහකූටය; (කැණිමඩල) විසංඛිතං, පළා විසුරුවන ලදී (සුණු විසුණු කරණ ලදී); චිත්තං, (මගේ) සිත; විසංඛාරගතං, (විසංඛාරවූ) නිර්වාණයට පැමිණියේය; තණ්හානං, තෘෂ්ණාවගේ; ඛයං, ක්ෂයභාවයට; (අනිත් ඵලයට) අජ්ඣගා ඉති, පැමිණියෙමියි මෙසේ උදන් අනා වදාළ සේක.

පටිච්චසමුප්පාද සන්නය

නිමි.

# ප්‍රතීත්‍ය සමුත්පාද වර්ණනාව.

## නමො බුද්ධාය.

ශ්‍රී සුගත තථාගත ශාක්‍යමුනීන්ද්‍රවූ අපගේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කිම් සමයෙක්හි "පටිච්ච සමුප්පාදය" අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කොට සර්වඥතාඥාන යට පැමිණ වදාළ සේක් ද?

එකල්හි භාගවත් වූ සර්වඥ රාජොත්තමයාණන්වහන්සේ උරුවෙල් දනව්වෙහි මඩ-කසවෙල්-බොර සහිත වූ නිතර බැස යන්නා වූ නීලවර්ණ ජලයෙන් ලීලොපෙත වූ නෙරඤ්ජරා නම් නදීහුගේ ඉවුර පෙදෙසක පිහිටියා වූ ශ්‍රී මහා බොධිරාජයන් වහන්සේගේ සමීපයෙහි වජ්‍රාසන මස්තකයෙහි අභිසම්බොධියට පැමිණ සියල්ලට පළමුව වැඩවාසය කර වදාරණ සේක.

මෙසේ බුද්ධ රාජ්‍යශ්‍රීයට පැමිණීමෙන් පසු සත් දවසක් මුළුල්ලෙහි අපරාජිත පර්‍ය්‍යඞ්කය බැඳ විදුරසුන් මතුයෙහි වැඩහුන් කාලයෙහි පටන් එක වරකුදු නො නැගිට බඳනා ලද පලඟ නො බිඳ එකම පර්‍ය්‍යඞ්කයෙන් යුක්තව විමුක්ති සැප (අර්හත් ඵල සමාපත්ති සුව) විඳිමින් වැඩහුන් සේක.

ඉක්බිතිව බුදුරජාණන් වහන්සේ රාත්‍රියගේ ප්‍රථම යාමය මුළුල්ලෙහි ද්වාදශාඞ්ගයකින් සමුපලක්ෂිත වූ "පටිච්ච සමුප්පාදය" අනුලොම ප්‍රතිලොම වශයෙන් හෙතුහුගේ උත්පත්තියෙන් ඵලය වන්නේය. හෙතුහුගේ නිරොධයෙන් ඵලය නිරුද්ධ වන්නේ යයි යන හෙතු ඵල දෙදෙනාගේ උත්පත්තිය නිරොධය මතු දක්වෙන පරිද්දෙන් මෙනෙහි කළ සේක.

### අනුලොම ක්‍රමය.

1 අවිජ්ජා පච්චයා සඞ්ඛාරා-
2 සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං-
3 විඤ්ඤාණ පච්චයා නාම රූපං-
4 නාම රූප පච්චයා සළායතනං-
5 සළායතන පච්චයා ඵස්සො-
6 ඵස්ස පච්චයා වෙදනා

7 වේදනා පච්චයා තණ්හා–
8 තණ්හා පච්චයා උපාදානං–
9 උපාදාන පච්චයා භවො–
10 භව පච්චයා ජාති–
11 ජාති පච්චයා ජරා–
12 මරණං සොක පරිදෙව දුක්ඛදොමනස්සු’පායාසා සම්භවන්ති.

එවමෙ’තස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති

1 අවිද්‍යාව ප්‍රත්‍යය වීමෙන් සංස්කාරයෝ ඇතිවන්නාහ. හෙවත් අනුවණකම හේතුකොට ගෙන භවගාමී කර්ම රැස්කර ගන්නාහුය.

2 සංස්කාරයන් ප්‍රත්‍යය වීමෙන් විඥාන යයි කියන ලද සිත ඇතිවේ.

3 විඥානය ප්‍රත්‍යය වීමෙන් නාමය හා රූපය ඇති වේ.

4 නාම රූප දෙක ප්‍රත්‍යය වීමෙන් (චක්ෂු, ශ්‍රොත, ඝ්‍රාණ, ජිව්හා, කාය. මනස් යන )ෂට්විධ ආයතනයෝ ඇතිවෙත්.

5 ෂඩායතනයන් ප්‍රත්‍යය වීමෙන් (රූප. ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන) ෂට්විධ ආරම්මණයන්ගේ ස්පර්ශ ඇති වේ.

6 ස්පර්ශය ප්‍රත්‍ය වීමෙන් (සුඛ, දුක්ඛ, උපෙක්ෂා යන) වේදනාව විඳීම ඇති වේ.

7 වේදනාව ප්‍රත්‍යය වීමෙන් (එකසිය අටක් ප්‍රභේද වූ) තෘෂ්ණාව ඇති වේ.

8 තෘෂ්ණාව ප්‍රත්‍යය වීමෙන් (අරමුණු දැඩිසේ ගැනීම් ලක්ෂණ කොට ඇති) උපාදානය ඇති වේ.

9 උපාදානය ප්‍රත්‍යය වීමෙන් (කාම, රූප, අරූප යන භවත්‍රයෙන් එක්තරා) භවයක් ඇති වේ.

10 භවය ප්‍රත්‍යයවීමෙන් (ස්කන්ධයන්ගේ පහළවීම යයි කියන ලද ජාතිය (උත්පත්තිය) ඇති වේ.

11 ජාතිය ප්‍රත්‍යය වීමෙන් ජරාව සහ මරණය (දිරීම සහ මැරීම) ඇති වේ.

12 ශෝකය, පරිදේවය, කායික දුක්, චෛතසික දුක් සිතෙහි දැඩි ආයාසය යන මොහුද පහළ වෙත්.

මෙසේ මේ සියලු දුක් රාශියගේ හටගැන්ම ඇති වේ. සංසාර ගතවූ සත්වයා භවයන්හි ගමනය කරන අයුරු මේ කියන ලද ක්‍රමයෙනි.

ඒ සසර ගමන් කිරීම නවත්වන පරිදි කෙසේද යත්:-

## ප්‍රතිලොම ක්‍රමය.

1 අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා
සංඛාර නිරොධො
2 සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො
3 විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො,
4 නාමරූප නිරොධා සළායතන නිරොධො,
5 සළායතන නිරොධා ඵස්ස නිරොධො,
6 ඵස්ස නිරොධා වෙදනා නිරොධො
7 වෙදනා නිරොධා තණ්හා නිරොධො
8 තණ්හා නිරොධා උපාදාන නිරොධො,
9 උපාදාන නිරොධා භව නිරොධො
10 භව නිරොධා ජාති නිරොධො,
11 ජාති නිරොධා ජරා-
12 මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා
නිරුජ්ඣන්ති.

එව මෙ තස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

1 අවිද්‍යාව (මෝඩකම) ඉතිරි නොකොට නිරුඬකලේ නම් සංස්කාරය නිරුඬ වේ.

2 සංස්කාරය නිරුඬවූ හෙයින් විඥාන යයි කියන ලද සිත නිරුඬ වේ.

3 විඥානය නිරුඬවූ හෙයින් නාම රූපයන්ගේ නිරොධය වේ.

4 නාම රූප දෙක නිරුඬවූ හෙයින් (චක්ෂු, ශ්‍රොත, ඝ්‍රාණ, ජිව්හා. කාය, මනස්, යන ෂට්විධ ආයතනයන්ගේ නිරොධය වේ.

5 ෂඩායතන නිරුඬවූ හෙයින් (රූප, ශබ්ද, රස, ස්පර්ශ, ධර්ම යන මේ අරමුණු නිසා ඇතිවෙන) ස්පර්ශය නිරුඬ වේ.

6 ස්පර්ශය නිරුඬවූ හෙයින් (සැප, දුක්, උපෙක්ෂා යන) වෙදනාව නිරුඬ වේ.

7 වෙදනාව නිරුඬවූ හෙයින් (එකසිය අටක් ප්‍රභෙද වූ) තෘෂ්ණාව නිරුඬ වේ.

8 තෘෂ්ණාව නිරුඬවූ හෙයින් (අරමුණු දැඩි ලෙස ගැනීම වූ ලොභ කොට ඇති) උපාදානය නිරුඬ වේ.

9 උපාදානය නිරුඬවූ හෙයින් භවය නිරුඬ වේ.

10 භවය නිරුද්ධවූ හෙයින් උත්පත්ති යයි කියන ලද ජාතිය නිරුද්ධ වේ.

11 ජාතිය (ඉපදීම) නිරුද්ධ වූ හෙයින් ජරාව හා මරණය (දිරීම සහ මැරීම) නිරුද්ධ වේ.

12 ශොක පරිදෙව, කායික දුක්, චෛතසික දුක්, සිතෙහි දැඩි ආයාශය යන මොහුද නිරුද්ධ වෙත්.

මෙසේ මේ සියළු දුක් රාශියගේ නිරොධය වේ. හෙවත් නැවත නූපදනා පරිද්දෙන් නැසීම වන්නේය.

මෙසේ "පටිච්චසමුප්පාදය" අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහිකොට වදාළ සේක.

---

## 1 අවිජ්ජාපච්චයා සඞ්ඛාරා.

අවිද්‍යාව ප්‍රත්‍යයවීමෙන් සංස්කාරයෝ පහළ වෙත්.

### 1 අන්ධොපිය අවිජ්ජා.

අවිද්‍යාතොමෝ අන්ධයෙක් වැනි වේ.



අන්ධයාගේ හුදකලා ගමන

අවිජ්ජා:- මේ වචනයේ තේරුම මෝඩකම යනුයි. විජ්ජා:- විද්‍යාව දැනගැන්ම. අ:-නැත්තේනුයි අවජ්ජා නම් වේ.

කාය දුච්චරිතාදි අවින්දියං නාම:- තං අවින්දියං අවින්දතීති-අවිජ්ජා.

කය, වචන, සිත යන තිදෙ, රින් සිදුවන්නාවූ දුශ්චරිතයෝ (දස අකුසල්) නො විඳිය යුතු (නො කටයුතු) පාපයෝ නම් වෙත්. ඒ පව් විඳීම හෝ කිරීම අවිද්‍යා නම් වන්නීය.

කය, වචන, සිත යන තුන් දෙ, රින් සිදුවන්නාවූ පූණ්‍ය ක්‍රියාවෝ විඳිය යුතු වූ (කටයුතු වූ කුශල කර්මයෝ නම් වෙත්. ඒ විඳිය යුතු කුශල් නො විඳිනුයි අවිද්‍යා නම් වන්නීය, මේ අවිද්‍යා යන්නෙහි සංක්ෂෙප තේරුමය.

තත්ථ කතමා අවිජ්ජා දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධ ගාමිනියා පටිපදාය අඤ්ඤාණං, පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ අඤ්ඤාණං, පුබ්බන්තා පරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණන්ති, ඉදං වුච්චති අවිජ්ජා.

එහි අවිද්‍යා නොහොත් කවරිද යත්?—දුඃඛ සත්‍යය නොදැනීමය, දුඃඛ සමුදය සත්‍යය නොදැනීමය, දුඃඛ නිරොධ සත්‍යය නොදැනීමය, දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යය නොදැනීමය (යන මේ චතුරාර්‍ය සත්‍යයන් නොදැනීම හා) පූර්වාන්ත සඞ්ඛ්‍යාත අතීත වූ ස්කන්ධ පස නොදැනීමය, අපරාන්ත සඞ්ඛ්‍යාතවූ අනාගත ස්කන්ධ පස නො දැනීමය, පූර්වාන්ත—අපරාන්ත සඞ්ඛ්‍යාත වූ අතීත අනාගත ස්කන්ධ පස නො දැනීමය, ඉදප්‍රත්‍යයතාවය හා ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයෙහි නොදැනීමය, යන යමක් ඇද්ද? මේ අවිද්‍යාව යයි කියනු ලැබේ.

ඒ මේ අවිද්‍යාව එනාහි කතවැල් අල්ලාගැනීමක් නැතිව තනිවම මාර්ගයෙහි ගමන් කරණ ජාත්‍යන්ධයෙකුට සමාන කොට දක්වන ලද හෙයින් ජාත්‍යන්ධයෙකුගේ රූපයක් මෙහි යෙදුවෙමු

පච්චයා— යන වචනයේ තේරුම ප්‍රත්‍යය වීමෙන්ය, හෙතු වීමෙන්ය, නිසාය කියායි. සංක්‍ෂෙප තේරුම මෙසේ සැළකිය යුතුයි.

අභිධර්මය පිටකයට අයත් පට්ඨාණ ප්‍රකරණ නම් මහා ග්‍රන්ථයෙහි "පච්චයා" යන මේ වචන "සුවිසි" ආකාරයකින් දක්වා තිබේ. ඒ මෙසේයි.

| | | | |
|---|---|---|---|
| 1 | හේතු ප්‍රත්‍යය | 13 | කර්ම ප්‍රත්‍යය |
| 2 | ආරම්මණ ප්‍රත්‍යය | 14 | විපාක පත්‍යය |
| 3 | අධිපති ප්‍රත්‍යය | 15 | ආහාර ප්‍රත්‍යය |
| 4 | අනන්තර ප්‍රත්‍යය | 16 | ඉන්ද්‍රිය ප්‍රත්‍යය |
| 5 | සමනන්තර ප්‍රත්‍යය | 17 | ධ්‍යාන ප්‍රත්‍යය |
| 6 | සහජාත ප්‍රත්‍යය | 18 | මාර්ග ප්‍රත්‍යය |
| 7 | අන්‍යොන්‍ය ප්‍රත්‍යය | 19 | සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය |
| 8 | නිශ්‍රය ප්‍රත්‍යය | 20 | විප්‍රයුක්ත ප්‍රත්‍යය |
| 9 | උපනිශ්‍රය ප්‍රත්‍යය | 21 | අස්ති ප්‍රත්‍යය |
| 10 | පුරේජාත ප්‍රත්‍යය | 22 | නාස්ති ප්‍රත්‍යය |
| 11 | පශ්චාජ්ජාත ප්‍රත්‍යය | 23 | විගත ප්‍රත්‍යය |
| 12 | ආසේවන ප්‍රත්‍යය | 24 | අවිගත ප්‍රත්‍යය |

මේ සුවිසි ප්‍රත්‍යය අවිද්‍යාදි ද්වාදශ ධර්මයන්ට ප්‍රත්‍යය විශේෂයන් පවත්නා බව දතයුතුයි.

## 2 "අන්ධස්ස උපලක්ඛණා විය අවිජ්ජා පච්චයා සඞ්ඛාරා"

අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්නා සංස්කාරයෝ දුක් ඉපදවීමට හේතුවන බැවින් අන්ධයාගේ පය පැකිළීමක් වැනි වේ.



අන්ධයාගේ පය කනුවක (හැපී) පැකිළීම.

සඞ්ඛාරාඃ– යන මේ වචනයේ තේරුම "රැස් කිරීමය" යනුයි. ඇතිවීම හා නැතිවීම ස්වභාව කොට පවත්නාවූ සියලු දෙයම "සඞ්ඛාරා" යන වචනයට ඇතුළත් වේ. සංක්ෂේපයෙන් මෙසේ දක්වූ නමුත් "සඞ්ඛාර" යන වචනයෙන් අර්ථ රාශියක් ප්‍රකාශ වේ.

1 පුණ්‍යාභි සංස්කාරය
2 අපුණ්‍යාභිසංස්කාරය
3 ආනෙඤ්ජාභි සං ස් සංස්කාරය.
4 කාය සංස්කාරය
5 වචී සංස්කාරය
6 චිත්ත සංස්කාරය
7 සංඛත සංස්කාරය
8 අභිසංඛත සංස්කාරය
9 අභිසංස්කරණක කාරය.
10 ප්‍රයොගභී සංස්කාරය

1 තත්‍ර පුඤ්ඤාභිසඞ්ඛාරො – දාන සීලාදි වසෙන පවත්තා, අට්ඨ කාමාවචර කුසල චෙතනා, භාවනාවසෙන පවත්තා පඤ්ච රූපාවචර කුසල චෙතනා චාති, තෙරස චෙතනා නාම.

2 අපුඤ්ඤාභි සංඛාරා පාණාතිපාතාදි වසෙන පවත්තා ද්වාදස අකුසල චෙතනා නාම.

3 ආනෙඤ්ජාභි සංඛාරො භාවනාවසෙනෙව පවත්තා චතස්සො අරූපාවචර කුසලචෙතනා නාමාති තයොපි සංඛාරා එකූනතිංස චෙතනා නාම හොන්ති.

4 එත්ථ කායවිඤ්ඤත්තිං සමුට්ඨාපෙත්වා කායද්වාරෙ පවත්තා අට්ඨ කාමාවචර කුසලචෙතනා ද්වාදස අකුසල චෙතනාති සම වීසති චෙතනා කාය සංඛාරා නාම.

5 තා එව වචීවිඤ්ඤත්තිං සමුට්ඨාපෙත්වා වචීද්වාරෙ පවත්තා වචී සංඛාරො නාම.

6 උභොපි විඤ්ඤත්තියො අසමුට්ඨාපෙත්වා මනොද්වාරෙ උප්පන්නා පන සබ්බාපි එකූනතිංස චෙතනා චිත්ත සංඛාරො නාම.

7 අනිච්චා වත සංඛාරාති ආදි වුත්තා සබ්බෙපි සප්පච්චයා ධම්මා සංඛත සංඛාරො නාම.

8 කම්මනිබ්බත්තා තෙභූමිකා රූපාරූප ධම්මා අභිසංඛත සංඛාරො නාම.

9 තෙභූමිකා කුසලාකුසල චෙතනා පන අභිසංඛරණක සංඛාරො නාම.

10 කායිකචෙතසිකා පන විරියං පයොගාභිසංඛාරො නාමාති වුච්චති.

1 ඒ දශවිධවූ සංස්කාරයන් අතුරෙන් දාන සීලාදි වශයෙන් පැවති "සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං" යනාදි ක්‍රමයෙන් දක්වන ලද අටවැදෑරුම්වූ කාමාවචර කුසල චෙතනාවෝද; භාවනා වශයෙන් පැවති "විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සංහිතං" යනාදි ක්‍රමයෙන් දක්වන ලද පස් වැදෑරුම්වූ රූපාවචර කුශල චෙතනාවෝද යන තෙළෙස් වැදෑරුම් කුශල චෙතනාවෝ පුණ්‍යාභිසංස්කාරය නම් වන්නේ ය.

2 ප්‍රාණඝාතාදීන්ගේ වශයෙන් පැවති "සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං" යනාදි ක්‍රමයෙන් දක්වන ලද දොළොස් වැදෑරුම් වූ අකුශල චෙතනාවෝ අපුණ්‍යාභිසංස්කාරය නම් වන්නේය.

3 භාවනා වශයෙන් පැවති "ආකාසානඤ්චායතන කුසල චිත්තං" යනාදි ක්‍රමයෙන් දක්වන ලද සිව් වැදෑරුම්වූ අරූපාවචර කුශල චෙතනාවෝ ආනෙඤ්ජාභිසංස්කාරය නම් වන්නේය. මෙ කියනලද එකුන්තිස් වැදෑරුම් චෙතනාවෝ ත්‍රිවිධ සංස්කාරයෝ නම් වන්නාහුය.

4 මේ සංස්කාරයන් අතුරෙන් කාය විඤ්ඤප්තිය උපදවා හෙවත් කායික ක්‍රියාකොට කායද්වාරයෙහි පැවතුණා වූ අටවැදෑරුම්වූ කාමාවචර කුසල චෙතනාවෝද දොළොස් වැදෑරුම් වූ

අකුශල චේතනාවෝද යන සමවිසි චේතනාවෝ කායසංස්කාරය නම් වන්නේය.

5 වාග් විඥප්තිය උපදවා වාග් ද්වාරයෙහි පැවැත්තාවූ ඒ සමවිසි චේතනාවෝම වචීසංස්කාරය නම් වන්නේය.

6 කාය වචී විඥප්තිද්වය ම නූපදවා මනෝද්වාරයෙහි පැවැත්තාවූ යට දක්වන ලද එකුන්තිස් වැදෑරුම් චේතනාවෝ චිත්ත සංස්කාරය නම් වන්නේය.

7 "අනිච්චා වත සඞ්ඛාරා" යනාදී ක්‍රමයෙන් දක්වන ලද සියලුම ප්‍රත්‍යයෙන් සංස්කරණය කරනු ලබන ධර්මයෝ සංඛත සංස්කාරය නම් වන්නේය.

8 කර්මයෙන් උපදවන ලද කාමභව රූපභව අරූපභව සංඛ්‍යාත ත්‍රෛභූමික වූ රූපාරූප ධර්මයෝ අභිසංඛත සංස්කාරය නම් වන්නේය.

9 ත්‍රෛභූමික කුශලාකුශල චේතනාවෝ වනාහි අභිසංඛරණක සංස්කාරය නම් වන්නේය.

10 කායික චෛතසික වීර්‍ය්‍ය වනාහි ප්‍රයෝගාභිසංස්කාරය නම් වන්නේයයි කියනු ලැබේ.

1 දුක්ඛපාත සංසාරෙ-සංඛාරානඤ්ච ලක්ඛණෙ
යො පටිච්චසමුප්පන්න-ධම්මෙසු ච විමුය්හති.

2 අභිසංඛරොති යො එත-සංඛාරෙ තිවිධෙ යතො
අවිජ්ජා පච්චයො තෙසං-තිවිධානං අයං තතො.

3 ඛන්ධානඤ්ච පටිපාටි-ධාතු ආයතනාන ච
අබ්බොච්ඡින්නං වත්තමානා-සංසාරොති පවුච්චති.

4 යථාපි නාම ජච්චන්ධො-නරො අපරිනායකො
එකදා යාති මග්ගෙන-උම්මග්ගෙනාපි එකදා.

5 සංසාරෙ සංසරං බාලො-තථා අපරිනායකො
කරොති එකදා පුඤ්ඤං-අපුඤ්ඤමපි එකදා.

6 යදා ච ඤත්වා යො ධම්මං-සච්චානි අභිසමෙස්සති
තදා අවිජ්ජූපසමා-උපසන්තො චරිස්සති 'ති.

යමෙක් තෙම දුඃඛ ප්‍රාප්ති සංඛ්‍යාත වූ සංසාරයෙහි ද සංස්කාරයන්ගේ ලක්ෂණයෙහි ද ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයෙහිද විශේෂයෙන් මුළා වේද,

2 හෙතෙම ත්‍රිවිධවූ යම් සංස්කාරයන් යම් හෙයකින් රැස් කෙරේ ද එහෙයින් ඒ ත්‍රිවිධ සංස්කාරයන්ට ම මේ අවිද්‍යාතොමෝ ප්‍රත්‍යය වන්නීය හෙවත් උපකාර වන්නීය.

3 ස්කන්ධයන්ගේ පිළිවෙළ ද, ධාතු ආයතනයන්ගේ පිළිවෙළ ද, අවිච්ඡින්නව නොසිඳී පවත්නේ සංසාරයයි කියනු ලැබේ.

4 යම් සේ වනාහි ජාත්‍යන්ධ වූ සත්ත්ව තෙම පරිනායක පුරුෂයකු (සැතවැල් අල්ලාගෙන ඉදිරියට යන්නෙකු නැතුව) හුදකලාව මඟට පිළිපන්නේ, සමහර වෙලාවක හරිමඟ යන්නේය. සමහර වේලාවක නොමඟින් යන්නේය.

5 එ පරිද්දෙන් ම සසර සැරිසරන්නාවූ අඥ තෙම විෂම මාර්ගය හැර, රහත් මඟට පමුණුවන කල්‍යාණ මිත්‍රයකු නැත්තේ සමහර කලෙක කුසල් කරන්නේය. සමහර කලෙක අකුසල් කරන්නේය.

6 යම් කලෙක්හි හෙතෙම කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රයෙන් චතුස්සත්‍ය ප්‍රකාශක වූ ත්‍රිපිටක ධර්මය දැන, චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කෙරේද, එකල්හි අවිද්‍යාවගේ ව්‍යුපශමයෙන් හෙවත් නසන ලද අවිද්‍යාව ඇතිව, ශාන්තව හැසිරෙන්නේය.

මේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්නා සංස්කාරයෝ දුකට හේතු වන බැවින් අන්ධයාගේ පය පැකිළීමක් වැනි වේ.

“අවිජ්ජා පච්චයා සඞ්ඛාරා”

යන මේ පදයෙහි සංක්ෂේප විභාගය යි.

---

## 2. සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං

(සංස්කාරයන් ප්‍රත්‍යවීමෙන් විඥානය “සිත” ඇති වේ.)

**“උපක්ඛලිතස්ස පතනං විය**
**සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං”**

සංස්කාර ප්‍රත්‍යයෙන් වන විඥාණය භවාන්තරයම පමුණුවන බැවින්

පය පැකිළුනාවූ අන්ධයාගේ වැටීමක් වැනිවේ.



අඬියාගේ පය පැකිල වැටීම.

විඥානය - සවැදෑරුම් වේ. ඒ කෙසේදයත්?

| | |
|---|---|
| 1 චක්ෂුර් විඥානය, | 4 ජිහ්වා විඥානය, |
| 2 ශ්‍රොත්‍ර විඥානය, | 5 කාය විඥානය, |
| 3 ඝ්‍රාණ විඥානය, | 6 මනො විඥානය, |

මෙසේ විඥානය සවැදෑරුම් වන්නේය.

තත්ථ චක්ඛු විඤ්ඤාණං කුසලවිපාකං, අකුසල විපාකන්ති දුවිධං හොති. තථා සොත, ඝාණ, ජිව්හා, කාය විඤ්ඤාණානි

මනො විඤ්ඤාණං කුසලාකුසල විපාකං, වෙ මනො ධාතුයො.

තිස්සො අහෙතුක මනො විඤ්ඤාණ ධාතුයො,
අට්ඨ සහෙතුකානි කාමාවචර විපාක චිත්තානි,
පඤ්චරූපාවචරානි, චත්තාරි අරූපාවචරානීති, වාවීසති විධං හොති.

ඉති ඉමෙහි ඡහි විඤ්ඤාණෙහි, සබ්බානිපි බත්තිංස ලොකිය විපාක විඤ්ඤාණානි සඞ්ගහිතානි හොන්ති.

ඒ සවැදෑරුම් විඥානයන් අතුරෙහි, චක්ෂුර් විඥානය කුශල විපාකය අකුශල විපාක යයි විප්‍රකාර වේ. ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා කාය විඥානයෝ ද එසේම කුශලා කුශල විපාක වශයෙන් දෙයාකාර වේ.

මනො විඥානය වනාහී කුශල විපාක සම්පටිච්ඡන්න චිත්තය, අකුශල විපාක සම්පටිච්ඡන්න චිත්තය යන දෙකය.

සොම්නස් සහගත කුශල විපාක සන්තීරණ චිත්තය, කුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය, අකුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය යන ත්‍රිවිධ චිත්තයෝය.

සහේතුක කාමාවචර විපාක සිත් අටකි. එනම්:

1 "සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරික මෙකං සසංඛාරික මෙකං

2 සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරික මෙකං සසංඛාරිකමෙකං.

3 උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසඛාරිකමෙකං.

4 උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං."

1 සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සසංස් කාරික සිත් දෙකය.

2 සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සසංස් කාරික සිත් දෙකය.

3 උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සසංස් කාරික සිත් දෙකය.

4 උපෙක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සසංස් කාරික සිත් දෙකය මන මේ සහේතුක විපාක සිත් අටය.

රූපාවචර විපාක සිත් පසකි. එනම්

1 "විතක්කවිචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන විපාක චිත්තං.

2 විචාරා පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන විපාක චිත්තං

3 පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන විපාක චිත්තං

4 සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන විපාක චිත්තං

5 උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන විපාක චිත්තං."

1 විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන විපාක චිත්තය.

2 විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ද්විතීයධ්‍යාන විපාක චිත්තය.

3 ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත තෘතීයධ්‍යාන විපාක චිත්තය.

4 සුඛ එකාග්‍රතා සහිත චතුර්ථධ්‍යාන විපාක චිත්තය,

5 උපෙක්ෂා එකාග්‍රතා සහිත පඤ්චමධ්‍යාන විපාක චිත්තය යන මේ රූපාවචර විපාක සිත් පසය.

අරූපාවචර විපාක සිත් සතරෙකි. එනම්:

1 “අකාසානඤ්චායතන විපාක චිත්තං.
2 විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තං.
3 ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තං.
4 නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තං.”

1 ආකාශානන්ත්‍යායතන විපාක චිත්තය.
2 විඥානානන්ත්‍යායතන විපාක චිත්තං
3 ආකිඤ්චන්‍යායතන විපාක චිත්තං
4 නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තං

මේ අරූපාවචර විපාක සිත් සතරය යන මොවුන්ගේ වශයෙන් දෙවිසි (22) වැදෑරුම් වේ.

මෙසේ මේ ෂඩ්විධ විඥානයෙන් සියළුම දෙතිස් (32) ලෞකික විපාක විඥානයෝ සංග්‍රහ කරන ලද්දාහු වෙත්.

කතරසඞ්ඛාර පච්චයා කතර විඤ්ඤාණානි ච?

කාමාවචර පුඤ්ඤාභිසඞ්ඛාර පච්චයා තාව කුසල විපාකානි පඤ්ච චක්ඛු විඤ්ඤාණාදීනි.

මනො විඤ්ඤාණෙසු එකා මනොධාතු ච මනො විඤ්ඤාණ ධාතුයො අට්ඨකාමාවචර මහා විපාකානීති සොළස හොන්ති.

කවර සංස්කාරයක් ප්‍රත්‍යකොට ගෙන කවර විඥානයෙක් පහළ වන්නේද යත්?

කාමාවචර පුණ්‍යාභිසංස්කාරය ප්‍රත්‍යයකොට ගෙන කුශල විපාකවූ චක්ෂු, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය යන මේ පංච විඥානය මනො විඥානයෙහි අරමුණු පිළිගන්නා ස්වභාව ඇත. සම්පටිච්ඡන චිත්තය, සොමනස් සහගත සන්තීරණ චිත්තය, කුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය, සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික සසංස්කාරික දෙසිතය, සොම්නස් සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික සසංස්කාරික දෙසිතය, උපෙක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික සසංස්කාරික දෙසිතය යන කාමාවචර මහාවිපාක සිත් අට යයි මෙසේ සොළසෙක් වන්නාහුය.

"රූපාවචර පුඤ්ඤාභිසංඛාර පච්චයා පන පඤ්චරූපාවචර විපාකානීති එවං පුඤ්ඤාභිසඞ්ඛාර පච්චයා එකවීසතිවිධං විඤ්ඤාණං හොති.

අපුඤ්ඤාභිසංඛාරපච්චයා පන අකුසල විපාකානි පඤ්ච චක්ඛු විඤ්ඤාණාදීනි; එකා මනොධාතු, එකා මනොවිඤ්ඤාණ ධාතූති, එවං සත්තවිධං විඤ්ඤාණං හොති.

අනෙඤ්ජාභිසංඛාර පච්චයා පන චත්තාරි අරූප විපාකානීති එවං චතුබ්බිධං විඤ්ඤාණං හොති සබ්බමෙව හි ඉදං පවත්ති පටිසන්ධිවසෙන ද්විධා පවත්තති.

ද්වෙ පඤ්චවිඤ්ඤාණානි ද්වෙ මනොධාතුයො සොමනස්ස සහගත අහෙතුක මනොවිඤ්ඤාණධාතූති ඉමානි තෙරසපඤ්චවොකාර භවෙ පවත්තියංයෙව පවත්තන්ති. සෙසා එකූනවීසති තීසු භවෙසු යථානුරූපං පවත්තියම්පි පටිසන්ධියම්පි පවත්තන්තීති.

එවං තාව බත්තිංසවිධම්පි විඤ්ඤාණං පවත්තියං සංඛාර පච්චයා පවත්තති; තත්‍රස්සතෙ සංඛාරා කම්මපච්චයෙන ච උපනිස්සයපච්චයෙන ච පච්චයා හොන්තීති ඤාතබ්බා."

රූපාවචර පුණ්‍යාභිසංස්කාරය ප්‍රත්‍යය කොට ගෙන වනාහි රූපාවචර විපාක සිත් පසදැයි මෙසේ පුණ්‍යාභිසංස්කාරය ප්‍රත්‍යය කොට ගෙන එක්විසි වැදෑරුම් විඥානය පහළ වන්නේය.

අපුණ්‍යාභිසංස්කාරය ප්‍රත්‍යය කොට ගෙන වනාහි අකුශල විපාකවූ චක්ෂු, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය යන මේ විඥාන පසද අකුශල විපාක සම්පටිච්ඡන්න අහෙතුක චිත්තය, උපෙක්ෂා සහගත අහෙතුක සන්තීරණ චිත්තය දැයි මෙසේ සත් වැදෑරුම් විඥානය වන්නේය.

ආනෙඤ්ජාභිසංස්කාරය ප්‍රත්‍යයකොට ගෙන යටදක්වන ලද සතර ප්‍රකාරවූ අරූප විපාක සිත් දැයි මෙසේ සිව්වැදෑරුම් විඥානය පහළ වන්නේය. මේ සියලු විඥානයම ප්‍රවෘත්ති වශයෙන්ද ප්‍රතිසන්ධි වශයෙන් දැයි ද්විප්‍රකාරයකින් පවත්නේයයි දතයුතුය.

එහි කුශලාකුශල විපාක වශයෙන් ද්විප්‍රකාරවූ චක්ෂුර්විඥානාදි පස දෙවැදෑරුම්වූ තල්කි දසකයෙක් වෙයි. කුශලාකුශල විපාක සම්පටිච්ඡන්න චිත්තවය හෙවත් කුශලාකුශල දෙපක්ෂයෙහි අරමුණු පිළිගන්නා දෙසිතය. සොම්නස් සහගත අහේතුක මනෝවිඥාන ධාතු සංඛ්‍යාත සන්තීරණ චිත්තය දැයි මේ තෙළෙස් විඥානයෝ පඤ්චවොකාර භවයෙහි ප්‍රවෘත්තියෙහිම ඇතිවන්නාහුය. ඉතිරිවූ එකුන්විසි විඥානයෝ කාමරූප සංඛ්‍යාත ත්‍රිවිධ භවයෙහි සුදුසු පරිද්දෙන් ප්‍රවෘත්තියෙහිද ප්‍රතිසන්ධියෙහිද ඇතිවන්නාහුය.

මෙසේ පළමු කොට දෙතිස් වැදෑරුම් විඥානයම පැවැත්වේති සංස්කාරය ප්‍රත්‍යය කොට ගෙන පවත්නේය. ප්‍රතිසන්ධි විඥානයට ඒ සංස්කාරයෝ කර්ම ප්‍රත්‍යයෙන්ද උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්ද ප්‍රත්‍යය වන්නාහුයයි දතයුත්තාහ.

මේ සංස්කාර ප්‍රත්‍යයෙන් වන විඥානය භවාන්තරයට පමුණු වන බැවින් පය පැකුළුනාවූ අන්ධයාගේ වැටීමක් වැනි වේ.

“සංඛාර පච්චයා විඤ්ඤාණං”

යන මේ පදයෙහි සංක්ෂෙප විභාගයයි.

---

## 3 විඤ්ඤාණ පච්චයා නාම රූපං.

(විඥානය (සිත) ප්‍රත්‍යය වීමෙන් නාම රූප දෙක ඇති වේ.)

## 4 “පතිතස්ස ගණ්ඩපාතුභාවො විය විඤ්ඤාණ පච්චයා නාමරූපං”

විඥාන ප්‍රත්‍යයෙන් වන නාම රූපය පය පැකිළ වැටුනාවූ අන්ධයාගේ ගඩ පහළ වීමක් වැන්න.



අන්ධයා වැටීමෙන් ඇතිවූ ගඩය

නාම රූපන්ති එත්ථ හි නාමන්ති ආරම්මණාභිමුඛං නමනතො වේදනාදයො තයො ඛන්ධා.

රූපන්ති චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං, තෙසං විභාගො ඛන්ධනිද්දෙසෙ වුත්තොයෙවාති.

එත්ථ පන නාමං ඒකං සත්තාවාසං ඨපෙත්වා සබ්බභවයොනි ගති විඤ්ඤාණට්ඨිති සෙස සත්තාවාසෙසු ච පවත්තති.

රූපං ද්වීසු භවෙසු චතූසු යොනීසු පඤ්චසු ගතීසු පුරිමාසු චතූසු විඤ්ඤාණට්ඨිතීසු පඤ්චසු ච සත්තාවාසෙසු පවත්තති.

නාම-රූප යන මෙහි වනාහි නාම යනු රූපාදි ආරම්මණ යන්ට අභිමුඛව නැමෙන [බැවින් වෙදනා, සංඥා, සංස්කාර යන මේ සකන්‍ධත්‍රය නාම නම් වේ.

රූපය නම් පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයෝ ද ඒ සතර මහා භූතයන් නිසා පවත්නා උපාදාන රූපයෝ ද යන විප්‍රකාර රූපයයි ඒ නාම රූපයන්ගේ විභාගය විභඞ්ගප්‍රකරණ යෙහි ඛන්‍ධ නිද්දේශයෙහි කියන ලද්දේ ම ය.

මෙය වනාහි නාමය තෙමේ අසඤ්ඤසත්තාවාසය හැර සියලු භවයොනි ගති විඤ්ඤාණ ඨිති යන සෙසු සත්තාවාසයන්හි ද පවත්නේය.

රූපය තෙමේ කාම භව රූප භව දෙක්හිද අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඔපපාතික යන සිවු යොනියෙහිද දෙවගතිය, මනුෂ්‍ය ගතිය, නිරය ගතිය, තිරශ්චීන ගතිය, ප්‍රෙතගතිය යන මේ පඤ්ච ගතියෙහිද පළමුවන සතර විඤ්ඤාණස්ථිතියෙහිද අරූප සත්තාවාස සතර හැර සෙසු සත්තාවාසයෙහි ද පවත්නේයි.

“නාමස්ස පාක විඤ්ඤාණං-නවධා හොති පච්චයො
වත්ථුරූපස්ස නවධා-සෙස රූපස්ස අට්ඨධා,
අභිසංඛාර විඤ්ඤාණං-හොති රූපස්ස එකධා,
තදඤ්ඤං පන විඤ්ඤාණං-තස්ස තස්ස යථාරහන්ති”

ප්‍රතිසන්‍ධියෙහි ද ප්‍රවෘත්තියෙහි ද රූප මිශ්‍රවූ හෝ අමිශ්‍රවූ හෝ යම් නාමයක් ඇද්ද, ඒ නාමයට ප්‍රතිසන්‍ධි විඤ්ඤාණයද අන්‍ය විපාක විඤ්ඤාණයෝ ද සජාත, අන්‍යොන්‍ය, නිශ්‍රය, සම්ප්‍රයුක්ත, විපාක, ආසති, අවිගත ආහාර, ඉන්‍ද්‍රිය, යන මේ නව ප්‍රකාරයෙන් ප්‍රත්‍යය වන්නාහුය. ප්‍රශාද හෘදය සඞ්ඛ්‍යාත සවැදෑරුම් වස්තු රූපයට සහජාත, අන්‍යොන්‍ය නිශ්‍රය, විපාක, ආහාර, ඉන්‍ද්‍රිය, විප්‍රයුක්ත, ආසති, අවිගත යන නවවිධ ප්‍රත්‍යයන්ගේ වශයෙන් ද ප්‍රත්‍යය වන්නාහුය. වස්තුරූපය හැර සෙසු රූපයන්ට මේ නවවිධ ප්‍රත්‍ය යෙන් අන්‍යොන්‍ය ප්‍රත්‍යය හැර සෙසු අටවැදෑරුම් ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නාහුය.

අභිසංස්කාර විඤ්ඤාණය හෙවත් කර්ම සහගත විඤ්ඤාණය අසඤ්ඤසත්ත්ව රූපයට හෝ පංච වොකාර භවයෙහි කර්මජ රූපයන්ට හෝ උපනිශ්‍රය වශයෙන් එක් ප්‍රකාරයකින්ම ප්‍රත්‍යය වන්නේය. ෙ සසු ප්‍රථමභවාඞ්ගය ආදි කොට ඇති අනික් සියලුම විඤ්ඤාණය ඒ ඒ

නාම රූපයට සුදුසු සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යවන්නේයයි දතයුතුයි

විඥාන ප්‍රත්‍යයෙන් වන නාම රූපය පැකිළ වැටුනා වූ අන්ධයාගේ ගඩ පහළවීමක් වැනි වේ.

"විඤ්ඤාන පච්චයා නාමරූපං"
යන මේ පදයෙහි සංක්ෂේප විභාග යයි.

---

## 4. නාම රූප පච්චයා සළායතනං

**නාම රූපයන් ප්‍රත්‍යවීමෙන් ෂඩ්විධ ආයතනයෝ ඇති වන්නාහුය.**

## 5. "ගණ්ඩභෙද පිළිකා විය නාමරූප පච්චයා සළායතනං"

නාමරූප ප්‍රත්‍යයෙන් වන ෂඩ්විධ ආයතනය අන්ධයාගේ ගඩයෙන් ප්‍රභෙදව නැඟී බිබිලි සයක් වැනිවේ.



අන්ධයාගේ ගඩයේ හටගත් බිබිලි සයක්

සළායතන නම් සවැදෑරුම් වූ ආයතනයෝ ය. කුමක් හෙයින් චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ ආයතන නම් වූවාහුද යත්:

ආයතනනොති ආයතනතො නය නීති ආයතනං, යනුවෙන් උපප්‍රාප්ති ස්ථානයෙහි ධර්මයන් පතුරුවන හෙයින් ද, සංසාර දුඃඛය පමුණුවන බැවින් ද, (සසර දික් කරණ හෙයින්ද) ආයතන නම් වේ.

සළායතනනති, ඡ ආයතනානි කථං?

1 චක්ඛායතනං, 4 ජිව්හායතනං,
2 සොතායතනං, 5 කායායතනං,
3 ඝාණායතනං, 6 මනායතනං

ඉති ඡබ්බිදං හොති

ෂඩායතන යනු සවැදෑරුම් වූ ආයතනයෝය, කෙසේද යත්.

**1** චක්ඛායතනය-හෙවත් චක්ෂුස මධ්‍යයෙහි උකුණු හිසක් පමණ වූ චක්ෂුර්විඥානයට වස්තුවාර භාවය (රූපාරම්මණයන්ගේ විජානන කෘත්‍ය) සාධමින් පවත්නා චක්ෂුඃ ප්‍රසාද සංඛ්‍යාතවූ චක්ඛායතනය.

**2** සෝතායතනය-හෙවත් ශ්‍රොත්‍ර බිලය ඇතුළත සිහින් තඹවන් රෝමයන් ගැවසීගත් කුඩා තඹ මුදුවක් වැනි ශ්‍රොත්‍ර විඥානයට වස්තුවාර භාවය (ශබ්දාරම්මණයන්ගේ විජානන කෘත්‍යය) සාධමින් පවත්නා ශ්‍රොත්‍රප්‍රසාද සංඛ්‍යාතවූ ශ්‍රොත්‍රායතනය.

**3** ඝාණායතනය-හෙවත් නාසිකාභ්‍යන්තරයෙහි අජපද සණ්ඨානාකාර ප්‍රදෙශයෙහි ඝ්‍රාණවිඥානයට වස්තුවාර භාවය (ගන්ධාරම්මණයන්ගේ විජානන කෘත්‍යය) සාධමින් පවත්නා ඝ්‍රාණ ප්‍රසාද සංඛ්‍යාතවූ ඝ්‍රාණායතනය †

**4** ජිව්හායතනය-හෙවත් දිවමැද උත්පල දලාග්‍ර සණ්ඨාන ප්‍රදෙශයෙහි ජිහ්වා විඥානයට වස්තුවාර භාවය (රසාරම්මණයන් ගේ විජානන කෘත්‍යය) සාධමින් පවත්නා ජිව්හා ප්‍රසාද සංඛ්‍යාත වූ ජිව්හායතනය.

**5** කායායතනය-හෙවත් කර්මජ තෙජො ධාතුව පිහිටි ස්ථාන ය හා මාංශ විනිර්මුක්තවූ කෙශාග්‍ර, ලොමාග්‍ර, නඛාග්‍ර, ශුෂ්කචර්ම, පිළිකාදීන් හැර අවශෙෂ සකල ශරීරයෙහි පැතිර (ස්පර්ශාරම්මණයන්ගේ විජානන කෘත්‍යය සාධමින්) පවත්නා කාය ප්‍රසාද සංඛ්‍යාත වූ කායායතනය.

**6** මනායතනය-හෙවත් (ධර්මාරම්මණයන්ගේ විජානන කෘත්‍යය සාධමින්) පවත්නා මනායතනය.

මෙසේ ආයතනය සවැදෑරුම් වේ.

නාමරූපං පනූභයං, හොති යං යස්ස පච්චයො
යථාච තමපි සබ්බත්ථ, විඤ්ඤාතබ්බං විභාවිනා.

නාමරූපවය යමක් යමකට ප්‍රත්‍යය වේද යම් ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේද, හෙද සියලු ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි නුවණැත්තන් විසින් යෙදෙන ප්‍රකාරයෙන් දතයුතුයි. උක්තප්‍රකාර නාමරූපවය ෂඩායතනයන්ට යෙදෙන යෙදෙන ආකාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ යයි දතයුතුයි.

---

† සෙම් කිපි කල්හි ඝ්‍රාණප්‍රසාදස්ථානය සෙමෙන් වැසී යන බැවින් සුගඳ දුගඳ හැඳිනීම නොවන්නේ යයි දතයුතුයි.

නාම රූප ප්‍රත්‍යයෙන් වන් මේ ෂඩ්විධ ආයතනය අන්ධයාගේ ගෙඩයෙන් නැගී පිළිකා සයක් වැනි වේ.

“නාම රූප පච්චයා සළායතනං.”
යන මේ පදයෙහි සංක්ෂෙප විභාග යයි.

---

## 5 සළායතන පච්චයා ඵස්සො

ෂඩ්විධ ආයතනයන් ප්‍රත්‍යය වීමෙන් ස්පර්ශය ඇතිවේ.

## 6 ගණ්ඩපිළිකානං ඝට්ටනං විය සළායතන පච්චයා ඵස්සො”

ෂඩ්විධ ආයතන ප්‍රත්‍යයෙන් වන ස්පර්ශය අන්ධයාගේ ගෙඩෙහි හමගත් බිබිලිවල ඝට්ටණයක් (-හැපීමක් වැනි වේ.)



අන්ධයාගේ බිබිලි සහිත ගෙඩිය ඝට්ටණයවී (හැපී) මක්.

ඵස්ස:-යනු චක්ෂූරාදීන්ම ආකාර වශයෙන් පවත්නා රූපාදි සය ආකාරවූ ආරම්මණයන් ගේ ස්පර්ශ යයි.

ඵස්සාති:- චක්ඛු සම්ඵස්සො, සොත සම්ඵස්සො, ඝාණ සම්ඵස්සො, ජිව්හා සම්ඵස්සො, කාය සම්ඵස්සො, මනො සම්ඵස්සො, ඉමෙ චක්ඛු සම්ඵස්සාදයො ඡ ඵස්සා භවන්ති.

විත්ථාරෙන පන චක්ඛු සම්ඵස්සා දසො පඤ්ච කුසල විපාකා, පඤ්ච අකුසල විපාකානි දස, සෙසා බාවීසති ලොකිය විපාක විඤ්ඤාණ සම්පයුත්තතාව බාවීසති එවං සබ්බෙපි සංඛාර පච්චයා වුත්ත විඤ්ඤාණම්ව ද්වත්තිංස හොන්ති.

යං පනෙ තස්ස ද්වත්තිංස විධස්සාපි ඵස්සස්ස පච්චයො සළායතනං,

| | |
|---|---|
| 1 චක්‍ෂු ස්පර්‍ශය | 4 ජිහ්වා ස්පර්‍ශය |
| 2 ශ්‍රොත්‍ර ස්පර්‍ශය | 5 කාය ස්පර්‍ශය |
| 3 ඝ්‍රාණ ස්පර්‍ශය | 6 මනඃ ස්පර්‍ශය |

මේ චක්‍ෂු ස්පර්‍ශාදිවූ ස්පර්‍ශයෝ සදෙනෙක් වෙත්.

විස්තර වශයෙන් වනාහි චක්‍ෂු ස්පර්‍ශාදි වූ කුශල විපාක ස්පර්‍ශ පසෙක්ද, අකුශල විපාක ස්පර්‍ශ පසෙක් දැයි දශයෙක් වන්නාහුය. සෙසු දෙවිසි ලෞකික විපාක විඥාන සම්ප්‍රයුක්ත වූවාහුද දෙවිස් සෙනැයි මෙසේ කියන ලද සියලු සංස්කාරක ප්‍රත්‍යයෙන් වන විඥානය මෙන් ස්පර්‍ශයෝද දෙතිසෙක් වෙතු.

මෙ දෙතිස් වැදෑරුම්වූ ස්පර්‍ශයට උක්තප්‍රකාර ෂඩායතනය ප්‍රත්‍යය වන්නේය,

ඡධා පඤ්ච තතො එකං නවධා බාහිරානිජ
යථා සම්භව මෙතස්ස පච්චයානෙත විභාවයෙති.

චක්ඛායතනාදි පස්දෙන වනාහි චක්ඛුසම්ඵස්සාදි භෙද භෙහින් පස්වැදෑරුම්වූ ස්පර්‍ශයට නිශ්‍රය, පුරෙජාත, ඉන්‍ද්‍රිය, විප්‍රයුක්ත, ආසත්ති, ‘අවිගත’ වශයෙන් ෂට්ප්‍රකාරයෙන් ප්‍රත්‍යය වෙති. ඊට අනතුරුව චක්‍ෂු, ශ්‍රොත, ඝ්‍රාණ, ජිහ්වා, කාය, විඥාන සංඛ්‍යාත එකෙකි විපාක මනායතනයෙක් අනෙක ප්‍රකාරයෙන් ප්‍රභෙද වූ විපාක ස්පර්‍ශයට සහජාත, අන්‍යොන්‍ය, නිශ්‍රය, විපාක, ආහාර, ඉන්‍ද්‍රිය, සම්ප්‍රයුක්ත, ආසත්ති, අවිගත වශයෙන් නවප්‍රකාරයෙන් ප්‍රත්‍යය වේ.

මනායතනය හැර රූපාදි බාහිරායතනයෝ චක්‍ෂු ස්පර්‍ශයට ආරම්මණ, පුරෙජාත, ආසත්ති, අවිගත වශයෙන් සතර සතර ආකාරයකින්ද එසේම ශබ්දායතනාදීහු ශ්‍රොත්‍ර ස්පර්‍ශාදීන්ට සතර සතර ආකාරයෙන් ද ප්‍රත්‍යය වෙත්.

මනඃ ස්පර්‍ශයට වනාහි ඒ ශබ්දායතනාදීහු හා ධර්මාරම්මණය ද ආරම්මණ ප්‍රත්‍යය මාත්‍රයෙන්ම ප්‍රත්‍යය වේ. මෙසේ බාහිරායතන සය සම්භවූ පරිද්දෙන් මේ ස්පර්‍ශයාගේ ප්‍රත්‍ය භාවයෙකි ප්‍රකාශිතයක.

මේ ෂඩ්විධ ආයතන ප්‍රත්‍යයෙන් වන ස්පර්‍ශය අඤ්ඤාගේ ගබෙහි හවගත් පිළිකා සය කණු ආදි ද්‍රව්‍යයක සර්‍ණයක් (හැපීමක්)වැනි වේ.

“සළායතන පච්චයා ඵස්සො”
යන මේ පදයෙහි සංක්‍ෂෙප විභාගය යි.

---

## 9. ඵස්ස පච්චයා වෙදනා

### ස්පර්ශය ප්‍රත්‍යය වීමෙන් වෙදනාව ඇති වේ

### 7 "ඝට්ටන දුක්ඛං විය ඵස්ස පච්චයා වෙදනා"

**ස්පර්ශය ප්‍රත්‍යයෙන් වන වේදනාව අඞ්ගාගේ බිබිලි සහිත ගෙඩිය ඝර්ෂණයෙන් (-හැපීමෙන්) ඇතිවූ වේදනාවක් වැනි වේ.**



අඞ්ගාගේ බිබිලි සහිත ගෙඩිය හැපීමෙන් වේදනාවක් (-විදීමක්) ඇති වේ.

**වේදනාව නම්: විඳීමයි.**

ස්පර්ශය නිසා සුඛ, දුක්ඛ, උපෙක්ෂා යන මේ වේද නාවෝ හටගනිත්.

(-මේ ඡඬ්ඩිවූ හය ආකාරවූ) අරමුණු හැපීම නිසා සැප වේදනා හයක්ද දුක් වේදනා හයක්ද දුකත් නොවූ සැපත් නොවූ උපෙක්ෂා වේදනා හයක්ද යන මේ දහඅට ආකාර වේදනාව (විඳීම) ඇතිවේ.

විස්තර වශයෙන් විභාගී මෙසේ සැලකිය යුතුවේ.

වාරතො වෙදනා වුත්තා, චක්ඛුසම්ඵස්සජාදිකා
සළෙව තා පභෙදෙන, ඡකුන නවුති මතා
වෙදනාසු පනෙතාසු, ඉධ බත්තිංස වෙදනා
විපාක සම්පයුත්තාව, අධිප්පෙතානි භාසිතා
අට්ඨධා එත්ථ පඤ්චන්නං, පඤ්චද්වාරම්හි පච්චයො
සෙසානං එකධා එසො මනොද්වාරෙපි සො තථා.

චක්ෂු ස්පර්ශයෙන් උපදින්නාවූද (ශ්‍රොත, ඝ්‍රාණ, ජිහ්ව, කාය, මනඃ යන මේ පඤ්චස්පර්ශයෙන් උපදින්නාවූද) සුඛ දුඃඛාදි වේද නාවෝ වාරවශයෙන් සදෙනෙක්ම කියනලදහ.

ඒ වේදනාවෝ ප්‍රභෙද වශයෙන් එකුන නවුයි චිත්තය සමග යෙදෙන බැවින් එකුන් අනූව කැයි දන්නා ලදහ.

මේ එකුන් අනූ වෙදනාවන් කෙරෙහි විපාක චිත්තයන් හා සම්ප්‍රයුක්තවූ දෙතිස් වේදනාවෝම මෙහි අභිමත බැව් කියන ලදහ.

එහි පඤ්චද්වාරයෙහි චක්ෂු ප්‍රසාදාදිය වස්තුකොට ඇත්තාවූ පඤ්ච වේදනාවන්ට චක්ෂු ස්පර්‍ශාදීහු ස්පර්‍ශය තෙම (සහජාත අන්‍යොන්‍ය නිශ්‍රය විපාක, ආහාර සම්ප්‍රයුක්ත, ආස්ති, අවිගත යන මොවුන්ගේ වශයෙන්) අෂ්ටප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ. එක් වාරයෙක්හි සම්පටිච්ඡන්න සන්තීරණ තදාරම්මණ වශයෙන් පවත්නාවූ සෙසු කාමාවචර විපාක වේදනාවන්ට ඒ චක්ෂු ස්පර්‍ශාදී වූ ස්පර්‍ශය තෙම උපනිශ්‍රය වශයෙන් එක් ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ. තදාරම්මණ වශයෙන් පවත්නාවූ කාමාවචර විපාක වේදනාවන්ට ඒ සහජාත මනඃ ස්පර්‍ශ සංඛ්‍යාත ස්පර්‍ශය තෙම එසේ ම අෂ්ට ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ.

පටිසන්ධිභවඞ්ග චුතිවසෙනච පවත්තානං තෙභූමික විපාක වෙදනානම්පි, යා පනෙතා මනොවාරෙ තදාරම්මණවසෙන පවත්තා කාමාවචරවෙදනා, තාසං මනොවාරාවජ්ජන සම්පයුත්තො මනො සම්ඵස්සො උපනිස්සය වසෙන එකධාව පච්චයො හොතීති.

ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවත්නා ත්‍රෛභූමික විපාක වේදනාවන්ටද සහජාත මනඃ ස්පර්‍ශ සංඛ්‍යාත ස්පර්‍ශ තෙම හා ජාත්‍යාදි වශයෙන් අෂ්ටප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ. මනොවාරයෙහි තදාරම්මණ වශයෙන් පවත්නා යම් කාමාවචර වෙදනා කෙනෙක් ඇද්ද ඔවුන්ට මනොවාරාවර්ජන සම්ප්‍රයුක්තවූ මනඃ ස්පර්‍ශ තෙම උපනිශ්‍රය වශයෙන් එක් ප්‍රකාරයකින් ප්‍රත්‍යය වන්නේයයි දත යුතුයි.

ස්පර්‍ශ ප්‍රත්‍යයෙන් වන වේදනාව අඞ්ගයාගේ බිබිලි සහිත ගඩය (-හැපීමෙන් හටගත් රිදුමක් වෙදනාවක්) වැනි වේ,

"ඵස්ස පච්චයා වෙදනා"

යන මේ පදයෙහි සංක්‍ෂෙප විභාගයයි.

---

## 7 "වෙදනා පච්චයා තණ්හා"

වෙදනා ප්‍රත්‍යය වීමෙන් තෘෂ්ණාව ඇති වේ.

## 8 "දුක්ඛස්ස පතිකාරාභිලාසො විය වෙදනා පච්චයා තණ්හා"

වෙදනාව නිසා හටගන්නා තෘෂ්ණාව අඬයාගේ රිදුමට පිළියම් (-බෙහෙත්) කරනු කැමැත්තක් මැනි වේ.



තෘෂ්ණාව නම්:ආසාවයි වේදනාව නිසා තෘෂ්ණාව හෙවත් ආසාව ඇතිවේ.

රූප තණ්හාදි භෙදෙන ඡ තණ්හා ඉධ දිපිතා එකෙකා තිවිධා තත්‍ථ පවත්තා කාරතො මතා

රූප තෘෂ්ණාදි භෙදයෙන් මෙහි තෘෂ්ණා සය දක්වන ලද්දාහුය. එහි පැවති ආකාරයෙන් එක එකක් තුන් වැදෑරුම් වේ.

අඬයා ජ් රිදුමට වෙදෙකු ලවා බෙහෙත් කරගනු කැමැතිවීම.

සෙට්ඨි පුත්තො බ්‍රාහ්මණ පුත්තොති පිතිතො නාමවසෙන පුත්තො එය ඉමා රූපතණ්හා. සද්දතණ්හා, ගන්ධ තණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හාති, ආරම්මණතො නාමවසෙන ඡ තණ්හා දීපිතා-පකාසිතා-සම්පිතාති අත්‍ථො.

සිටු පුත්‍රයා බ්‍රාහ්මණ පුත්‍රයා යයි පියාගේ නමින් ප්‍රසිද්ධවූ පුත්‍රයා මෙන් මේ රූප තෘෂ්ණා, ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා, රස තෘෂ්ණා, ස්පර්ශ තෘෂ්ණා, ධර්ම තෘෂ්ණායයි ආරම්මණයන්ගේ නම් වශයෙන් තෘෂ්ණා සදෙනෙක් දක්වන ලදහ.

1 රූප තණ්හා–රූපය කෙරෙහි පවත්නා ආසාවය,
2 සද්ද තණ්හා–ශබ්දය කෙරෙහි පවත්නා ආසාවය,
3 ගන්ධ තණ්හා–ගන්ධය කෙරෙහි පවත්නා ආසාවය,
4 රස තණ්හා–රසය කෙරෙහි පවත්නා ආසාවය,
5 ඵොට්ඨබ්බ තණ්හා–පහස කෙරෙහි පවත්නා ආසාවය,
6 ධම්ම තණ්හා–සිතට අරමුණුවූ දෙය කෙරෙහි පවත්නා ආසාවය,

තාසු පන තණ්හාසු එකේකා තණ්හා පවත්ති ආකාරතො කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හාති එවං තිවිධා මතා.

ඒ සවැදෑරුම් තෘෂ්ණාවන් අතුරෙහුදු එක එක තෘෂ්ණාවක් පැවති ආකාරයෙන් කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාව යයි මෙසේ තුන් ආකාරයකින් දක්නා ලදහ.

1 රූප තණ්හා යෙවහි යදා චක්ඛුස්ස ආපාථමාගතං රූපාරම්මණං කාමස්සාදවසෙන අස්සාදයමානා පවත්තතීති. තදා කාම තණ්හා නාම හොති.

2 යදා තදෙවාරම්මණං ධුවං සස්සතන්ති පවත්තාය සස්සතදිට්ඨියා සද්ධිං පවත්තති තදා භවතණ්හා නාම හොති, සස්සතදිට්ඨි සහගතො හි රාගො භවතණ්හාති වුච්චති.

3 යදා පන තදාරම්මණං උච්ඡිජ්ජති විනස්සතීති පවත්තාය උච්ඡෙදදිට්ඨියා සද්ධිං පවත්තති. තදා විභව තණ්හා නාම හොති, උච්ඡෙදදිට්ඨි සහගතො හි රාගො විභව තණ්හාති වුච්චති.

එසෙව නයො සද්ද තණ්හාදීසුපීති, එතා අට්ඨාරස තණ්හා හොන්ති.

1 රූප තෘෂ්ණාවම යම් කලෙක්හි ඇසට අභිමුඛ වූ රූපාරම්මණයක් කාමස්වාද වශයෙන් (–කාමරස විඳීම් වශයෙන්) ආස්වාදය කෙරෙමින් පවතීද එකල්හි කාම තෘෂ්ණා නම් වේ.

2 යම් කලෙක්හි ඒ අරමුණම ස්ථිරය සදාකාලිකය යයි කියා පැවති ශාස්වත දෘෂ්ටිය සමග පවතීද එකල්හි භව තෘෂ්ණා නම් වේ. ඒ එසේමය. ශාස්වත දෘෂ්ටිය සහගත රාගය භව තෘෂ්ණා යයි කියනු ලැබේ.

3 යම් කලෙක්හි වනාහි ඒ අරමුණම සිඳෙන්නේය විනාශවන්නේ යයි පැවති උච්ඡේද දෘෂ්ටිය සමග පවතීද එකල්හි විභව තෘෂ්ණා නම් වේ. ඒ එසේමය. උච්ඡේද දෘෂ්ටිය සහගත රාගය විභව තෘෂ්ණා යයි කියනු ලැබේ.

ශබ්ද තෘෂ්ණාදීන්හි ද මේ ක්‍රමය මැයි. මෙසේ මොවුහු අටළොස් තෘෂ්ණාවෝ නම් වෙත්.

තා අජ්ඣත්තත රූපාදීසු අට්ඨාරස, බහිද්ධා අට්ඨාරසාති ඡත්තිංස.

ඉති අතීත ඡත්තිංස, අනාගතා ඡත්තිංස, පච්චුප්පන්නා ඡත්තිංසා, අට්ඨ සත තණ්හා හොන්තීති.

ඔවුහු අධ්‍යාත්මික රූපාරම්මණාදීන් කෙරෙහි දසඅටෙ(18)ක

බාහිර රූපාරම්මණාදීන් කෙරෙහි දස අටෙ (18) ක මෙසේ සතිසෙ (36) ක් වෙයි.

අතීත කාලයෙහි සතිසෙක, 36
අනාගත කාලයෙහි සතිසෙක, 36
වර්තමාන කාලයෙහි සතිසෙක, 36

මේ එකසිය අට (108) ක් තෘෂ්ණාවෝ නම් වෙත්,

තා පුන සංඛිප්පමානා රූපාදි ආරම්මණවසෙන ඡ, කාම තණ්හාදිවසෙන වා තිස්සොව තණ්හා හොන්තීති වෙදිතබ්බා.

ඔව්හු නැවත සංක්‍ෂෙප කළ කල්හි රූපාදි ආරම්මණයන්ගේ වශයෙන් සයට හෝ කාමතෘෂ්ණාදීන්ගේ වශයෙන් තුනට හෝ ගණිනු ලැබෙත්. මෙ තයින් තෘෂ්ණාවෝ ත්‍රිවිධ ම වන්නාහුයයි දත යුතුයි.

යස්මා පනිමෙ සත්තා පුත්තං අස්සාදෙත්වා පුත්තෙ මමත්තෙන ධාතියා විය රූපාදි ආරම්මණවසෙන උප්පජ්ජමානං වෙදනං අස්සාදෙත්වා වෙදනාය මමත්තෙන රූපාදි ආරම්මණදායකානං චිත්තකාර ගන්ධබ්බ ගන්ධික සූද තන්තවාය රසායන විධායක වෙජ්ජාදීනං මහාසක්කාරං කරොන්ති. තස්මා සබ්බාපෙසා වෙදනා තණ්හා හොතීති වෙදිතබ්බා.

යම් හෙයකින් මේ සත්ත්වයෝ පුත්‍රයා ආස්වාදයකොට පුත්‍රයා කෙරෙහි ඇති මමත්වයෙන් කිරිමව්ට සත්කාර කරන්නාක් මෙන් රූපාදි ආරම්මණයන්ගේ වශයෙන් උපදින වේදනාව ආස්වාදය කොට වේදනාව කෙරෙහි ඇති මමත්වයෙන් රූපාදි අරමුණු සපයා දෙන්නාවූ සිතුයම් කාරයෝය, ගී කියන්නෝය, සුවඳ සප යන්නෝය, රසකයෝය, රෙදි වියන්නෝය, රසායන බෙහෙත් සපයන වෙදවරුය යන මේ ආදීන්ට මහත්වූ සත්කාර කෙරෙත් ද, එහෙයින් මේ සියලුම තෘෂ්ණාව වේදනාව ප්‍රත්‍යයකොට කෙතම වන බව දත යුතුයි.

යස්මා චෙත්ථ අධිප්පෙතා, විපාකා සුඛ වෙදනා
එකාව එකධා චෙසා, තස්මා තණ්හාය පච්චයො

දුක්ඛී සුඛං පත්ථයති, සුඛී භිය්‍යොපි ඉච්ඡති
උපෙක්ඛා පන සන්තත්තා, සුඛමිච්චෙව භාසිතා

තණ්හාය පච්චයා තස්මා, හොන්ති තිස්සොපි වෙදනා
වෙදනා පච්චයා තණ්හා, ඉති වුත්තා මහෙසිනා

යම් හෙයකින් මෙහි විපාක චිත්ත සම්ප්‍රයුක්ත වූ සුඛ වෙදනාව ම අභිමත ද එහෙයින් ඒ සුඛ වෙදනා තොමෝ එකම උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් තෘෂ්ණාවට ප්‍රත්‍යය වන්නීය.

දුක්ඛිත වූයේ සැපයක් ම ප්‍රාර්ථනා කරන්නේය, සුඛිත වූයේ බොහෝ සෙයින් ම සැප කැමති වන්නේය. උපෙක්ෂාව වනාහි ශාන්ත හෙයින් සැපයයි කියනු ලදී.

එහෙයින් සුඛ, දුඃඛ, උපෙක්ෂා යන ත්‍රිවිධ වෙදනාවෝ ම තෘෂ්ණාවට ප්‍රත්‍යය වන්නාහ. වෙදනාව ප්‍රත්‍යයකොට ගෙන තෘෂ්ණාව හටගන්නී යයි මෙසේ බුදුරජාණන් වහන්සේ විසින් වදාළසේක.

උපෙක්ෂාව ශාන්තභාවයෙන් සුඛයයි වදාළ බැවින් බොහෝ සැප කැමැත්තහුගේ තෘෂ්ණාවට උපෙක්ෂාව ද ප්‍රත්‍යය වන බව දත යුතුයි.

වෙදනාව නිසා හටගන්නා තෘෂ්ණාව අන්ධයාගේ පිදුමට පිළියම් (-බෙහෙත්) කරනු කැමැත්තක් වැනි වේ.

"වෙදනා පච්චයා තණ්හා"
යන මේ පදයෙහි සංක්ෂෙප විභාග යයි.

## 8 තණ්හා පච්චයා උපාදානං

(-තෘෂ්ණාව ප්‍රත්‍යය වීමෙන් උපාදානය ඇති වේ.

## 9 "පතිකාරාභිලාසෙන අසප්පායගණ්හං විය "තණ්හා පච්චයා උපාදානං"

**තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වන උපාදානය පිළියම් (බෙහෙත්) කරන කැමැත්තෙන්**

**අඩියාගේ රිදුමට අසප්පාය ඖෂධ ග්‍රහණයක් වැනි වේ.**



අඩියාගේ ඒ රිදුමට වෙද විසින් අපථ්‍ය ඖෂධයක් (බෙහෙතක්) දීම

උපාදානය: අරමුණු දැඩි සේ (තදින්) අල්වා ගනු ලැබීම උපාදාන නම් වේ.

ඒ කෙසේදයත්?

මණ්ඩූකං පන්නගො වියං දල්හං ආදියති-උපාදියතීති-උපාදානං

(-නාගයකු විසින් මැඩියෙක් දැඩිසේ අල්ලා ගන්නාක් මෙන් තෘෂ්ණාව විසින් රූපාදි සය ආකාර අරමුණු තදින් අල්වා ගැනීම උපාදාන නම් වේ.

1 කාමුපාදානය.
2 දිට්ඨුපාදානය.
3 සීලබ්බතුපාදානය,
4 අත්තවාදුපාදානය.

**1** තත්ථ කතමං කාමුපාදානං? යො කාමෙසු කාමච්ඡන්දො කාම රාගො කාම නන්දි කාම තණ්හා කාම සිනෙහො කාම පරිළාහො කාම මුච්ඡා කාමජ්ඣොසානං ඉදං වුච්චති කාමුපාදානන්ති.

**2 තත්ථ කතමං දිට්ඨුපාදානං? නත්ථි දින්න ත්‍යාදික දස වත්ථුකා එවරූප, මිච්ඡාදිට්ඨි විපරියෙස ගාහො ඉදං වුච්චති දිට්ඨුපාදානන්ති.**

**3 තත්ථ කතමං සීලබ්බතුපාදානං? සීලෙන සුද්ධි, වතෙන සුද්ධි, සීලබ්බතෙන සුද්ධීති, යා එවරූපා දිට්ඨි-පෙ-විපරියෙස ගාහො ඉදං වුච්චති සීලබ්බතුපාදානන්ති.**

4 තත්ථ කතමං අත්තවාදුපාදානං? ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං.

වෙදනං අත්තතො -පෙ- අත්තානං, සඤ්ඤං අත්තතො -පෙ- අත්තානං සඞ්ඛාරෙ අත්තතො -පෙ- අත්තානං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති -පෙ- විපරියෙස ගාහො ඉදං වුච්චති වීසති වත්ථුකා සක්කාය දිට්ඨි අත්තවාදුපාදානන්ති.

1 එහි කාමුපාදානය කවරේ ද? පඤ්චකාමයෙහි මේ කාමච්ඡන්දයෙක් ඇද්ද? (කාමච්ඡන්දය නම් රූපාදි අරමුණෙහි දුර්වල ඇල්මය.) යම් කාම රාගයෙක් ඇද්ද? (කාම රාගය නම් රූපාදියෙහි බලවත් ඇල්මයි.) යම් කාම නන්දියක් ඇද්ද? යම් කාම තෘෂ්ණාවක් ඇද්ද? යම් කාම ස්නෙහයෙක් ඇද්ද? යම් කාම පරිලාහයෙක් ඇද්ද? යම් කාම මූර්ඡාවෙක් ඇද්ද? යම් කාමානුභවයෙක් ඇද්ද? සංක්ෂෙප වශයෙන් මේ කාමුපදාන යයි කියනු ලැබේ.

විස්තර වශයෙන් වනාහි රූපාදී සාරමුණෙහි කියන ලද එක් සිය අටක් ප්‍රභෙද ඇති තෘෂ්ණාවගේ දැඩි බව කාමුපදාන යයි දත යුතුයි.

2 එහි දිට්ඨුපාදානය නම් කවරේ ද? දුන් දෙයෙහි විපාක නැත්තේය යනාදිවූ දශ වස්තුකවූ යම් මිථ්‍යාදෘෂ්ටියෙක් ඇද්ද? යම් විපරීත ග්‍රහණයෙක් ඇද්ද? මේ දෘෂ්ටි උපාදාන යයි කියනු ලැබේ.

3 එහි සීලබ්බතුපදානය නම් කවරේ ද? ශීලයෙන් පිරිසිඳු වන්නේය, ව්‍රතයෙන් පිරිසිඳු වන්නේය. ශීල ව්‍රත දෙකින් පිරිසිඳු වන්නේ යයි යම් දෘෂ්ටියෙක් ඇද්ද? යම් විපරීත ග්‍රහණයක් ඇද්ද? මේ සීලබ්බතුපදානයයි කියනු ලැබේ.

එහි අත්තවාදුපාදානය නම් කවරේද? මේ ලෝකයෙහි ආර්ය්‍ය ධර්මයෙහි දක්ෂනො වූ ආර්ය්‍ය ධර්මයෙහි නො හික්මුණාවූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම රූපය ආත්මය වශයෙන් දක්නේද? තමා රූපවත් යයිද තමා කෙරෙහි රූපය පිහිටියේ යයිද රූපයෙහි තමා පිහිටියේ යයිද මේ සතර ආකාරයෙන් ආත්ම වශයෙන් රූපය මනාකොට දක්නේද? වේදනා, සංඥා, සංස්කාරයන් හික් මෙම ක්‍රමය මැයි.

විඥානය ආත්ම වශයෙන් දක්නේ ද තමා විඥානවත් යයි ද තමා කෙරෙහි විඥානය පිහිටියේ යයි ද විඥානයෙහි තමා පිහිටියේ යයි ද මේ සතර ආකාරයෙන් ආත්ම වශයෙන් මනාකොට විඥානය දක්නේ ද යන යම් විපරීත ග්‍රහණයෙක් ඇද්ද? මේ විංශති වස්තුකවූ සත්කාය දෘෂ්ටිය අත්තවාදුපාදාන යයි කියනු ලැබේ.

රූපය, වේදනාය, සංඥාය, සංස්කාරය, විඥානය යන මේ පස ආත්ම වශයෙන් ගන්නේ මේ පඤ්චස්කන්ධයෙහි උච්ඡේද දෘෂ්ටි වශයෙන් යයි දත යුතුයි. අවශේෂ පසළොස් තන්හි ශාශ්වත දෘෂ්ටි වශයෙනි.

තණ්හාව පුරිමසෙසනං, එකධා හොති පච්චයො
සත්තධා අට්ඨධා වාපි, හොති සෙසත්තයස්සසා.

මේ උපාදාන චතුෂ්කයෙහි පළමුවූ කාමූපාදානයට කාම තෘෂ්ණාතොමෝ උපනිශ්‍රය වශයෙන් එනම ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ. සෙසු උපාදාන තුනට ඒ තෘෂ්ණා තොමෝ “සහජාත, අන්‍යොන්‍ය, නිශ්‍රය සම්ප්‍රයුක්ත, ආසති, අවිගත, හෙතු” වශයෙන් සත් ආකාරයකින් හෝ උපනිශ්‍රය ප්‍රත්‍යය සමග යථොක්ත සහජාතාදී සත්වැදෑරුම් ප්‍රත්‍යයන් සහිත අට ආකාරයෙන් හෝ ප්‍රත්‍යය වන්නේය.

ඒ තෘෂ්ණා තොමෝ යම් කලෙක්හි උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වේද එකල්හි සහජාත ප්‍රත්‍යය නොව උපනිශ්‍රයෙන් ම ප්‍රත්‍යය වේයයි දත යුතුයි.

තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වන උපාදානය පිළියම් (බෙහෙත්) කරනු කැමැත්තෙන් අඛයාගේ රිදුමට අසප්පාය ඖෂධ ග්‍රහණයක් වැනි වේ.

“තණ්හා පච්චයා උපාදානං”
යන මේ පදයෙහි සංක්ෂේප විභාග යයි.

## 9. උපාදාන පච්චයා භවො.

(–උපාදානය ප්‍රත්‍යය වීමෙන් භවය ඇති වේ.)

## 10. උපාදින්න අසප්පායා ලෙපනං විය උපාදාන පච්චයා භවො

**උපාදාන ප්‍රත්‍යයෙන් වන භවය දුකට හෙතුවන බැවින් අන්ධයා විසින් ගන්නාලද සැප නොවූ බෙහෙත ආලෙප කිරීමක් වැනි වේ.**

භවොති චෙත්ථ භවතීති භවො, සො කම්ම භවො, උපපත්ති භවො චාති දුවිධො හොති.

භවය යන මෙහිදු ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාකය වේනුයි භාවය නම් වේ. ඒ භවය [illegible] කර්‍ම භවය, උත්පත්ති භවයයි දෙවැදෑරුම් වේ.

ධර්‍ම වශයෙන් චතානි කර්‍ම භවය නෙමේ සංක්‍ෂෙප වශයෙන් චේතනා වද, චේතනා සම්ප්‍රයුක්ත වූ අභිධ්‍යාදිවූ කර්‍ම සංඛ්‍යාත ධර්‍මයෝද වෙත්.



අන්ධයා විසින් අපථ්‍ය බෙහෙත බිබිලි සහිත ගඩයේ ගැල්වීම,

1 තත්ථ කතමො කම්මභවො? පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො, පරිත්ත භූමකො වා මහග්ගත භූමකො වා අයං වුච්චති කම්මභවො, සබ්බම්පි භවගාමි කම්මං කම්ම භවොති.

2 තත්ථ කතමො උපපත්ති භවො කාම භවො රූප භවො අරූපභවො සඤ්ඤා භවො අසඤ්ඤා භවො නෙවසඤ්ඤා නාසඤ්ඤා භවො ඒකවොකාර භවො චතුවොකාර භවො පඤ්චවොකාර භවො අයං වුච්චති උපපත්ති භවොති.

1 එහි කර්‍ම භවය කවරේද? තෙලෙස් කුසල චේතනා සංඛ්‍යාත පුණ්‍යාභිසංස්කාරය ද, ද්වාදශවිධ අකුශල චේතනා සංඛ්‍යාත අපුණ්‍යාභිසංස්කාරය ද, චතුර්විධ අරූප චේතනා සංඛ්‍යාත ආනෙඤ්ජාභිසංස්කාරය ද, ඒ චේතනාවන්ගේ ස්වල්ප විපාක ඇත්තාවූ පරිත්තභූමකය හෝ මහත් විපාක ඇත්තාවූ මහග්ගතභූමකය හෝ භව යයි කියනු ලැබේ.

චෙතනා සම්ප්‍රයුක්ත වූ අභිධ්‍යාදි සංඛ්‍යාත වූ සියලු භවගාමී කර්මය කර්මභව යයි දතයුතු.

උත්පත්ති භවය වනාහි සංක්ෂෙපයෙන් කුශලාකුශල කර්මයෙන් උපදවන ලද ස්කන්ධයෝ වෙත්. ප්‍රභෙද වශයෙන් නව වැදෑරුම් වේ.

2 එහි "උත්පත්ති භවය" කවරේද? සතර අපාය හා මිනිස් ලොව ද, චාතුර්මහාරාජිකය ආදිකොට ඇති සදිව්‍ය ලොකය ද යන එකොළොස් වැදෑරුම්වූ කාම භවය ද, බ්‍රහ්මපාරිෂද්‍යාදිවූ ෂොඩශවිධ වූ බඹතල සංඛ්‍යාත රූප භවය ද, ආකාසානඤ්චායතන ආදිවූ සිවු වැදෑරුම් වූ බඹතල සංඛ්‍යාත අරූප භවය ද, කාම භවයයි කියා දක්වූ එකොළොස් ස්ථානය හා රූප භව යයි කියා දක්වූ ෂොඩශවිධ බ්‍රහ්මලොක අතුරෙන් අසංඥ තලය හැර බ්‍රහ්මපාරිෂද්‍යාදි අනික් පසළොස් වැදෑරුම් බඹ තලයෝ ද, අරූපාවචරයෙහි ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය ආකිඤ්චඤ්ඤායතනය යන මේ තුන්තලය හා මෙසේ දක්වන ලද විසිනව වැදෑරුම්වූ සඤ්ඤ භවයද, අසඤ්ඤතල සංඛ්‍යාත අසඤ්ඤ භවයද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යයි කියන ලද අරූපතල සංඛ්‍යාත නෙවසඤ්ඤානාසඤ්ඤ භවය ද, එකම රූපොපාදානස්කන්ධයෙන් ආකීර්ණවූ බැවින් ඒකවොකාර භවයයි කියනලද අසඤ්ඤතලය ද, රූපොපාදානස්කන්ධය හැර අවශෙෂ සතර ස්කන්ධයන් ආකීර්ණවූ ආකාසානඤ්චායතනාදි අරූපතල සංඛ්‍යාත චතුවොකාර භවයද, පඤ්චොපාදානස්කන්ධයෙන් ආකීර්ණවූ කාම භවයයි දක්වූ එකොළොස් ස්ථානය හා රූප භව යයි දක්වූ සොළොස් බඹ තලයෙන් අසඤ්ඤතලය හැර අවශෙෂ පසළොසද යන මේ "සවිසි ස්ථාන" සංඛ්‍යාත පඤ්චවොකාර භවයද යන මේ නවවිධ භව විධ භවයෙක් ඇද්ද ඒ මේ උත්පත්ති භවයයි කියනු ලැබේ.

මේ උපාදානයන් කෙරෙහි කවර උපාදානයෙක් කවර භවය කට ප්‍රත්‍යය වේද යත්:

> රූපාරූප භවානං උපනිස්සයො පච්චයා උපාදානං
> සහජාතාදිහිපි තං කාම භවස්සාපි විඤ්ඤෙය්‍යා

රූපාරූප භවයන්ට චතුර්විධ උපාදානය උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වේ. ඒ උපාදානය කාම භවයට සහජාතාදි වශයෙනුදු ප්‍රත්‍යය වේ යයි දත යුතුයි.